LAKSALA
State Gift & Souvenir Boutique

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

இலங்கை கைப்பணிகள் சபை

Sri Lanka Handicrafts Board



# 2018

# වාර්ෂික වාර්තාව

# ஆண்டு அறிக்கை

# Annual Report

LAKSALA

STATE GIFT & SOUVENIR BOUTIQUE

# වාර්ෂික වාර්තාව 2018

## ලක්සල

## ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

පටුන


| | |
|---|---|
| සංස්ථාපිත තොරතුරු | 1 |
| ලක්සල ප්‍රදර්ශනාගාර ජාලය | 2 |
| දැක්ම සහ මෙහෙවර ප්‍රකාශය | 3 |
| කාර්යය සමාලෝචනය 2018 | 4 -7 |
| මෙහෙයුම් සමාලෝචනය | 8 -11 |
| කළමනාකරණය | 12 – 13 |
| අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෝ | 14 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායම් | 15 |


**මූල්‍ය වාර්තා**


| | |
|---|---|
| විස්තීර ආදායම් ප්‍රකාශය | 17-18 |
| මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය | 19 |
| කොටස් හිමිකම් වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය | 20 |
| මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය | 21 |
| මූල්‍ය ප්‍රකාශ වල සටහන් | 22 – 38 |
| විගණකාධිපති වාර්තාව | 39 |

# සංස්ථාපිත තොරතුරු

## මණ්ඩලයේ නම

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය- ලක්සල

## නෛතික ආකෘතිය

1982 අංක 35 දරණ ජාතික ශිල්ප සභා සහ අනුබද්ධ ආයතන පණතින් සංස්ථාපිත ව්‍යවස්ථාපිත මණ්ඩලයකි

## ප්‍රධාන කාර්යාලය

අංක : 215, බෞද්ධාලෝක මාවත, කොළඹ 7

දුරකථන : 011 2055717 / 011 2055501

ෆැක්ස් : 011 2594872

විද්‍යුත් තැපෑල : *info@laksala.gov.lk*

වෙබ් අඩවිය : www.laksala.gov.lk

## අලෙවි තොරතුරු විමසුම්

දුරකථන : 011 2680925

විද්‍යුත් තැපෑල : info@laksala.gov.lk

## විගණකවරු

විගණකාධිපති දෙපාර්තමේන්තුව

## බැංකුකරුවෝ

ලංකා බැංකුව

මහජන බැංකුව

# ලක්සල ප්‍රදර්ශණාගාර ජාලය

| | | |
|---|---|---|
| 1.කොටුව | අංක. 60, යෝක් වීදිය, කොළඹ 01. | 0112323514 |
| 2.තුම්මුල්ල | අංක.215, බෞද්ධාලෝක මාවත,තුම්මුල්ල, කොළඹ 07. | 0112580579 |
| 3.නුවර | අංක.05, සංඝරාජ මාවත, නුවර. | 0812222087 |
| 4.කටුබැද්ද | අංක.282, ගාලු පාර, කටුබැද්ද මොරටුව,. | 0112605600 |
| 5.ජාතික කෞතුකාගාරය ලක්සල, කෞතුකාගාර පරිශ්‍රය, කොළඹ 07. | | 0112698263 |
| 6.බත්තරමුල්ල | අපේ ගම, පැලවත්ත, බත්තරමුල්ල. . | 0112786026 |
| 7.තුරග තරග පිටිය | තුරග තරග ගොඩනැගිල්ල, රීඩ් මාවත, කොළඹ 07, | 0112677772 |
| 8.වැලිපැන්න I | දක්ෂිණ අධිවේගී මාර්ගය,නැවතුම, ‘‘ඒ’’ ශාඛාව ඒ4 එසහ ඒ5, වැලිපැන්න. | 0342241607/8 |
| 09. ගාල්ල | අංක.74/1, සමුද්‍ර මාවත, ගාල්ල. | 0912222783 |
| 10.පින්නවල | අලි අනාථාගාරය, පින්නවල , . | 0352265015 |
| 11.පේරාදෙණිය | අංක.14, උද්භිද උද්‍යානය, පේරාදෙණිය. | 0812389253/63 |
| 12.කටුනායක | 54 ඩී, සංක්‍රමණික වෙන්ව යාමේ කලාපය, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල, කටුනායක | 0112260167 |

# අපේ දැක්ම

ශ්‍රී ලංකාවේ ත්‍යාග සහ සමරු භාණ්ඩ වෙළඳපල ප්‍රමුඛයා බවට පත්වීම.

# අපේ මෙහෙවර

**ත්‍යාග සහ සමරු භාණ්ඩ ක්ෂේත්‍රය තුළ වර්ධනීය අවස්ථා පුළුල් කරමින් සහ සංචාරක කර්මාන්තයට උසස් වටිනාකම් එකතු කළ දායකත්වයක් සපයමින් ග්‍රාමීය නිපැයුම්කරුවන්හට පුළුල් වෙළඳපල අවස්ථා විවර කරමින් සමාජ වගකීම ඉටුකරන වාණිජ වශයෙන් සඵලදායී ආයතනයක් බවට පත්වීම**

.

# අපේ කේන්ද්‍රීය වටිනාකම්

- තත්වය, විශ්වසනීයත්වය සහ මුදලට වටිනාකම.
- විවිධවූ මානයන්ගෙන් යුක්තව හොඳම පාරිභෝගික තේරීම උදෙසා අවස්ථා සම්පාදනය.
- ග්‍රාමීය ප්‍රජාව අතර වටිනාකම් නිර්මාණය සහ වටිනාකම් හුවමාරුව.
- පාරිභෝගිකයා උපරිම ලෙස තෘප්තිමත් කිරීම.

# තිරසර සංවර්ධන ඉලක්ක

- 2030 වසර වනවිට දේශීය සැපයුම්කරුවන්ගෙන් මිලට ගනු ලබන නිපැයුම් ප්‍රමාණය දෙගුණ කරමින් දේශීය නිර්මාණ ප්‍රවර්ධනය.
- 2030 වසර වනවිට ස්ත්‍රී පුරුෂ සමානාත්මතාව ළඟා කරගැනීමේ අරමුණින් ලක්සල භාණ්ඩ සපයන කාන්තා සැපයුම්කරුවන්ගේ මුළු සංඛ්‍යාව 50% කින් වර්ධනය කිරීම.
- විශේෂ අවශ්‍යතා ඇති ප්‍රජාව දිරිගැන්වීම පිණිස 2030 වසර වනවිට විශේෂ අවශ්‍යතා ඇති සැපයුම්කරුවන්ගේ සංඛ්‍යාව 25% කින් වර්ධනය කිරීම


Art &
Craft


Handloom
&
Batik


Leather &
Ceramics


Tea &
Spices


Premium
Range
Organic
DESICCATED
Coconut
CARELA
CARELA
Butler


Gem &
Jewellery




දේශීය අත්කම් නිපැයුම්කරුවන්හට දේශීය මෙන්ම විදේශීය වෙළඳපල අවස්ථා විවර කිරීමේ අරමුණින් 1964 වසරේදී ලක්සල ආයතනය ස්ථාපිත කරන ලද අතර 1982 අංක 35 දරණ ජාතික ශිල්ප සභා සහ අනුබද්ධ ආයතන පණත යටතේ ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය වශයෙන් එය සංස්ථාපිත කරන ලදී. මෙකී ක්ෂේත්‍රය තුළ මේවන විට ලක්සල රජය සතු පැරණිතම සහ විශාලතම ජාලය බවට පත්ව තිබේ.

.








## පාරිභෝගික තෘප්තිය තහවුරු කෙරෙනා ප්‍රසන්න පාරිභෝගික සේවාවක් සැපයිය හැකිවනු පිණිස කාර්යමණ්ඩල සාමාජිකයන් තුළ ධනාත්මක ආකල්ප සංවර්ධනය කිරීම

නූතන වෙළඳපල ප්‍රවණතා හා සහසම්බන්ධ වෙමින් ඉදිරියට යනු පිණිස වන පිරිස් බලයෙහි ප්‍රබල අවශ්‍යතාවක් ලක්සල වෙත ඇති හෙයින් අභිප්‍රේරණය සහ අවශ්‍ය විධිමත් පුහුණුව සැපයීම තුළින් කාර්යමණ්ඩලයේ කාර්යක්ෂමතාව ඉහල නැංවීම සමගින් ස්ථීර සහ කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව පිලිවෙලින් 40% සහ 60% අනුපාතයට පවත්වාගෙන යමින් තරගකාරී කාර්යමණ්ඩලයක් නඩත්තු කිරීමට පියවර ගන්නා ලදී. විශිෂ්ට පාරිභෝගික සත්කාරයක් සහතික කිරීම උදෙසා අවශ්‍යවන නව බඳවාගැනීම් පිලිබඳ සමස්ත ක්‍රියාවලියම කොන්ත්‍රාත් පත්වීම් පදනම මත සපුරා ගනු ලැබිණි. සේවකයන් ලබාගන්නා වැටුප් සහ දීමනා ඔවුන්ගේ කාර්යක්ෂමතා සහ ඵලදායිතා මට්ටම් සමග සම්බන්ධ කිරීම මගින් ආයතනයේ මූලික අරමුණු තවදුරටත් සාධනය කරගැනීම උදෙසා මෙකී පියවර මගින් සැලසුන දායකත්වය ඉමහත්ය.

## සැපයුම්කරුවන්ගේ ජාලය

ස්වකීය ප්‍රදර්ශණාගාර හරහා වන ලක්සල සැපයුම් ජාලය මගින් අලෙවි කිරීමට අපේක්ෂිත ත්‍යාග සහ සමරු මිලටගැනීම, නිපැයුම් මාර්ග සැලසුම් කිරීම, තත්ව පාලනය සහ නවීන මෝස්තර සම්පාදනය සිදුකරනු ලබයි. 2017 වසරේ අවසානභාගය වනවිට 700 දෙනකු ලෙස ලියාපදිංචිව සිටි දේශීය අත්කම් නිපැයුම්කරුවන්ගේ සංඛ්‍යාව මේ වසර තුළ තවත් වර්ධනය වී තිබූ අතර මේ ක්ෂේත්‍රයන් තුළට ප්‍රවේශ වීම පිණිස නව නිපැයුම්කරුවන්ට නව වෙළඳපල අවස්ථාවන්ද තවදුරටත් පුළුල් කරනු ලැබිණි.

## අන්තර්ජාලය හරහා මාර්ගගත අලෙවි පහසුකම් සඳහා ප්‍රවේශය සැලසීම

2018 වසර තුළදීද ලොව කොතැන වුව සිටිනා පාරිභෝගිකයන්ට සිය රුචිය පරිදි ලක්සල අලෙවි භාණ්ඩ මිලට ගැනීමට මාර්ගගත අන්තර්ජාල වෙළඳ පහසුකම් සඳහා පිවිසුමක් සපයන අටියෙන් ලක්සල ආයතනය විසින් ස්වකීය අලෙවිකරණ ක්‍රමවේදයන් වඩාත් පුළුල් මට්ටමින් ක්‍රියාත්මක කරනු ලැබිණි. .

## වසර තුළ ක්‍රියාත්මක කරන ලද වැදගත් පුහුණු වැඩසටහන්

- ප්‍රසම්පාදනය පිලිබඳ පුහුණු වැඩසටහන්
- කාර්යාල කළමනාකරණය සහ මුදල් රෙගුලාසි පිලිබඳ පුහුණු වැඩ සටහන
- ස්ථාවර වත්කම් කළමනාකරණය පිලිබඳ පුහුණු වැඩසටහන
- ශ්‍රම ඵලදායකත්වය පිලිබඳ පුහුණු වැඩසටහන
- ලේඛණ කළමනාකරණය සහ සංරක්ෂණය පිලිබඳ පුහුණු වැඩසටහන

## පාර්ශවකරුවන් සමග සම්බන්ධවීම

| පාර්ශවකාර කණ්ඩායම | සම්බන්ධවූ මාර්ගය | සංවිධානයෙහි උනන්දුව දැක්වෙන ප්‍රධාන කලාප |
|---|---|---|
| කාර්ය මණ්ඩලය | • පාරිභෝගික තෘප්තිය පිළිබඳ සමීක්ෂණ<br>• අභ්‍යන්තර චක්‍රලේඛ<br>• අන්තර්ජාල<br>• දුක්ගැනවිලි කළමනාකරණ පරිපාටි<br>• ප්‍රධාන විධායක නිලධාරී සමග කුඩා කණ්ඩායම් රැස්වීම් | • වෘත්තීය සෞඛ්‍ය සහ ආරක්ෂාව<br>• පාරිශ්‍රමික සහ ප්‍රතිලාභ<br>• වෘත්තීමය ප්‍රගතිය<br>• කුසලතා සහ දැනුම සංවර්ධනය<br>• සේවා ස්ථානයේ මානව හිමිකම්<br>• රැකියා දිවියෙහි සමබරතාව |
| පාරිභෝගිකයන් | • පාරිභෝගික තෘප්තිය පිළිබඳ සමීක්ෂණ<br>• සෘජු සම්බන්ධතා<br>• පාරිභෝගික සේවා සහ සම්බන්ධතාවන්හී උපකාරක ස්ථාන<br>• වෙබ් අඩවි | • නිපැයුම්හී තත්වය සහ විශ්වසනීයත්වය<br>• ආචාරධර්ම වලට අනුකූලව හැසිරීම<br>• දෙන ලද මිලෙහි වටිනාකම<br>• නව වෙළඳපල සහ පාරිභෝගික අවශ්‍යතා සපුරාලීම පිණිස නව නිපැයුම් නිර්මාණය |
| රජය සහ අනෙක් නියාමනකරුවන් | • චක්‍රලේඛ<br>• මූල්‍ය සහ අනෙක් වාර්තාකරණ<br>• රැස්වීම් | • ආචාරධර්ම වලට අනුකූලව හැසිරීම<br>• පාරිසරික සහ සමාජ පාලනය<br>• තිරසර ලාභදායකත්වය |
| සැපයුම්කරුවන් සහ සේවා සම්පාදකයන් | • සෘජු සම්බන්ධතා<br>• සැපයුම්කරු ඇගයුම්<br>• සෘජු සංවාද<br>• රැස්වීම් | • ශිල්පීන් සහ ව්‍යවසායකයන් ආරක්ෂා කිරීම සහ දිරිගැන්වීම<br>• ආචාරධර්ම වලට අනුකූලව හැසිරීම<br>• මෙහෙයුම්හී කාර්යක්ෂමතාව සහ සඵලදායකත්වය<br>• තරගකාරීත්ව වාසි |

# මෙහෙයුම් සමාලෝචනය






SPECIAL
SEASONAL OFFER
15%


LAKSALA
Legend of Pure Ceylon Tea
Premium

## සාරාංශගත මූල්‍ය කාර්ය සාධනය

සමාලෝචිත වසර තුළ ලක්සල රුපියල් 737, 283,033 ක සමස්ත පිරිවැටුමක් වාර්තා කළ අතර ඊට අදාල විකුණුම් පිරිවැය රුපියල්. 306,324,003. පහත දැක්වෙන ප්‍රස්ථාරය මගින් පසුගිය වසර කිහිපය තුළ ලක්සල ආයතනයේ මෙහෙයුම් සාරාංශය ඉදිරිපත් කෙරේ.




2018 වසරතුළ සිදුවූ විකුණුම් විශ්ලේෂණය මගින් තුම්මුල්ල ප්‍රදර්ශණාගාරය ප්‍රදර්ශණාගාරයන්හී අලෙවිය අතරට රුපියල් 314,092,034ක විශාල දායකත්වයක් සපයා ඇති බවත් ඊට පසු විශාලම දායකත්වය සිදුකර ඇත්තේ කෞතුකාගාරයේ ඇති ප්‍රදර්ශණාගාරයෙන් බවත් එහි පිරිවැටුම රුපියල් . 93,089,687.ක් බවත් පෙනී යයි.



# මිලදී ගැනුම් විෂ්ලේෂණය

**2018** වසර තුළ ලක්සල ආයතනය රුපියල්309,685,841 ක් වටිනා මිලදීගැනුම් සිදුකර ඇති අතර පසුගිය පස් වසරක කාලය තුළ ලක්සල ආයතනයේ මිලදී ගැනුම් පහත ප්‍රස්ථාරය මගින් පෙන්නුම් කෙරේ.




2018 වසරතුළ සිදු කරන ලද මිලදී ගැනුම් භාණ්ඩ වර්ගීකරණය අනුව තව දුරටත් පහත ප්‍රස්ථාරය මගින් ඉදිරිපත් කෙරේ. 2018 වසරේ සිදු කරන ලද මිලදී ගැනුම් සලකා බැලීමේදී ඉන් ඉහල ප්‍රතිශතයක් ගන්නේ කලා කෘති සහ අත්කම් භාණ්ඩවලට බව පෙනී යයි.



## වියදම් විශ්ලේෂණය

**2018 වසර තුළ අනුගමනය කරන ලද පිරිවැය අවම කිරීමේ ක්‍රියාමාර්ග හේතුවෙන් වියදම් රුපියල් 477,158,666 දක්වා පහත හෙලීමට හැකිවූ අතර එය පෙර වසර සමග සසඳා බලද්දී 10.64%ක ප්‍රගතියක් වාර්තා කරයි.**

.

| | 2018 | 2017 |
|---|---|---|
| පරිපාලන වියදම් | 313,643,115 | 349,774,444 |
| බෙදාහැරීමේ වියදම් | 56,287,682 | 55,789,513 |
| අපනයන වියදම් | - | 1,173,468 |
| මූල්‍ය පිරිවැය | 51,289,163 | 70,421,241 |
| බදු වියදම් | 5,149,100 | - |
| | **426,369,060** | **477,158,666** |

පසුගිය වසර සමග සසඳා බැලීමේදී මුළු පිරිවැය සංයුතිය පහත ප්‍රස්ථාරය මගින් ඉදිරිපත් කෙරේ.



# කළමනාකරණය



ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය-ලක්සල, එහි සමස්ත මෙහෙයුම් ක්‍රියාකාරකම්වලට අදාල වන පනත්, රජයේ චක්‍රලේඛ, සහ අනෙකුත් මූල්‍ය සහ පරිපාලන උපදෙස් අනුගමනය කරමින් සිය ක්‍රියාකාරකම් ඉටු කර ඇති අතර යහපාලන සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් නිසි ලෙස අනුගමනය කර ඇති බව සහතික කෙරේ. සංවිධානයෙහි ඉලක්ක සහ අරමුණු ළඟාකර ගැනීමේදී මෙන්ම අනෙක් උපකාරක සේවාවන් සම්පාදනයේදී ආයතනයේ පරිපාලන සහ මානව සම්පත් අංශය කළමනාකරණය සම්බන්ධයෙන් වැදගත් කාරයභාරයක් ඉටු කර ඇත. සමාලෝචිත වර්ෂය තුළ ආයතනයේ කාර්ය මණ්ඩලය 135 දෙනකුගෙන් සමන්විත වූ අතර ඒ පිලිබඳ විස්තර පහත දැක්වේ.

2018.12.31 දිනට සමස්ථ කාර්යය මණ්ඩලය

| | | |
|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 08 | |
| ද්විතීක මට්ටම | 08 | |
| තෘතීක මට්ටම | 57 | |
| ප්‍රාථමික මට්ටම | 10 | 83 |
| | | |
| කොන්ත්‍රාත් පදනම මත කාර්යය මණ්ඩලය | 52 | |
| **සමස්ථ කාර්යය මණ්ඩලය** | **135** | |

පෙර වසර සමග සසඳා බැලීමේදී සමාලෝචිත වර්ෂය තුළ කාර්ය මණ්ඩල තත්වය 158 සිට 135 දක්වා අඩුවී තිබෙන බව පෙනී යයි. තරගකාරී අලෙවි පරිසරයක් තුළ මනාලෙස සකසන ලද කෙටි කාලීන, මධ්‍ය කාලීන සහ දිගු කාලීන ව්‍යාපාරික සැලසුම් ක්‍රියාත්මක කිරීම උදෙසා වන ප්‍රයත්නයේදී මනා ලෙස පුහුණුව ලද, කැපවුණු සහ කාර්යක්ෂම කාර්ය මණ්ඩලයක් ගොඩනැංවීම යන්න තීරක කාර්යභාරයක් ඉටු කරයි. අලෙවි කාර්යමණ්ඩලය මෙන්ම සහය කාර්යමණ්ඩලය වෙත ආකර්ශණීය දිරිදීමනා ක්‍රමයක් හඳුන්වාදෙමින් සහ ඔවුන් හට පුහුණු සහ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මගින් සේවකයන්ගේ ගුණාත්මකභාවය සහ ඵලදායකත්වය වර්ධනය කිරීමට පියවර ගනු ලැබිණි. මීට අමතරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සහිතව සමස්ත සේවක සංඛ්‍යාව 201 වන පරිද්දෙන් නව සංවිධාන ව්‍යුහයක්ද සකසන ලදී. තවද, සමස්ත කාර්ය මණ්ඩලය 40%ක ස්ථීර සේවකයන් සහ 60% කොන්ත්‍රාත් සේවකයන්ගෙන් සමන්විත වන පරිදි පවත්වාගෙන යාමට උපදෙස් ලබාදෙන ලදී. එසේ කිරීම මගින් ආයතනයට අඩු කැපකිරීමක් සහ වගකීම් දැරීමක් සිදුවන අයුරින් එහි අලෙවි අංශයට මෙන්ම අනෙක් අංශවලටද අදාල සුදුසුකම් සහිත නව කාර්ය මණ්ඩලයක් පවත්වා ගැනීමට හැකිවූ බව සතුටින් පෙන්වාදිය හැකිය.

# ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය - ලක්සල

## අධ්‍යක්ෂ මණ්ඩලය

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 01 | එම් හම්සා මහතා | සභාපති |
| 02 | කේ.පී.එච්. විජේවර්ධන මහතා | මණ්ඩල සාමාජික |
| 03 | එන්.නයනචන්ද්‍ර මහතා | මණ්ඩල සාමාජික |
| 04 | ජී.ඩී.එස්.පී.කුමාර මහතා | මණ්ඩල සාමාජික |
| 05 | ඒ.ඒ.ඒ.රුවායිස් මහතා | මණ්ඩල සාමාජික |
| 06 | එච්.එම්.එම්.රුවායිත් මහතා | මණ්ඩල සාමාජික |
| 07 | ආචාර්ය. එස්.එම්.එම්. ඉස්මයිල් මහතා | සභාපති (2018/04/26 දින තෙක්) |
| 08 | ආර්.ඒ.එල්.උදයකුමාර මහතා | මණ්ඩල සාමාජික(2018/05/11 දින තෙක්) |
| 09 | ජී.ඩබ්. සෝමරත්න මහතා | මණ්ඩල සාමාජික(2018/05/11 දින තෙක්) |
| 10 | එච්.ජී. දන්දෙණිය මහතා | මණ්ඩල සාමාජික(2018/05/11 දින තෙක්) |
| 11 | අයි.රියාස් මහතා | මණ්ඩල සාමාජික(2018/09/18 දින තෙක්) |

# ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය - ලක්සල

## ජ්‍යෂ්ඨ කළමණාකරණ කණ්ඩායම

| | |
|---|---|
| එම්.එන්.එම්.ඒ.අල්හාම් මහතා | අධ්‍යක්ෂ ජනරාල්/ප්‍රධාන විධායක |
| සී.එන්.දහනායක මහතා | අධ්‍යක්ෂ (මානව සම්පත්/පරිපාලන) |
| කේ.සී.ජයවර්ධන මහතා | අධ්‍යක්ෂ (අලෙවි) |
| ඊ.ඇලන් ඩෙලිල්කන් | වැඩ බලනඅධ්‍යක්ෂ (මූල්‍ය) |
| කේ.පී.පී.එස් කේ. පතිරණ මහතා | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
| දේවිකා කුමාරි අතුකෝරළ මිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ (බෙදාහැරීම්) |
| විජිතා සමරරත්න මිය | නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) |
| සම්පත් සෙනෙවිරත්න මහතා | සහකාර අධ්‍යක්ෂ (මානව සම්පත්/පරිපාලන) |
| දිනේෂ් අබේකෝන් මහතා | තොරතුරු තාක්ෂණ අංශ ප්‍රධාන |

## අපේ කෘතඥතාව

සියල්ලටම පළමුව මම ලක්සල වෙනුවෙන් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී, සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපතිතුමා, ගරු අග්‍රාමාත්‍යතුමා, ගරු කර්මාන්ත සහ වාණිජ, අවතැන්වූවන් නැවත පදිංචිකිරීමේ, සමූපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු, සහ කුසලතා සංවර්ධන අමාත්‍යතුමා සහ නියෝජ්‍ය අමාත්‍යතුමා හට මහත් කෘතවේදීත්වය පුදදෙනු කැමැත්තෙමි. අප ආයතනය ක්ෂේත්‍රයන්හි ඉහලම ස්ථානයකට නංවාලනු පිණිස නිරතුරු ඇවැසි තීරණ සහ නිගමනයන් ලබාදීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්හටද කෘතවේදීත්වය පුදනු කැමැත්තෙමි.

තවද, අවශ්‍ය සෑම අවස්ථාවකම අප ආයතනයේ ප්‍රගතිය උදෙසා ලබාදුන් සහය වෙනුවෙන් මම කර්මාන්ත සහ වාණිජ, අවතැන්වූවන් නැවත පදිංචිකිරීමේ, සමූපකාර සංවර්ධන සහ වෘත්තීය පුහුණු, සහ කුසලතා සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමන්ටද කෘතවේදීත්වය පළ කර සිටිමි.

ආයතනයේ පරිපාලන, මූල්‍ය සහ අලෙවි කටයුතු වඩා හොඳින් ඉටුකිරීම පිණිස අප කාර්ය මණ්ඩල සාමාජිකයන් මෙන්ම සමස්ත කාර්ය මණ්ඩලයම විචක්ෂණ ලෙස මෙහෙයවීම සම්බන්ධයෙන් මම සියළු අංශ ප්‍රධානීන් හට ස්තුතිය පුද කරමි. ආයතනයේ ව්‍යාපාර කටයුතු කාර්යක්ෂම සහ සඵලදායී ලෙස පවත්වාගෙන යාම උදෙසා ඔවුන්ගේ සහය බෙහෙවින් ඉවහල් විණි.

අප සමග අත්වැල් බැඳගනිමින් පාරිභෝගික අවශ්‍යතා නිවැරදිව හඳුනාගෙන, නව නිපැයුම් හඳුන්වා දෙමින්, සම්ප්‍රදායික මෙන්ම නව්‍ය වූ නිපැයුම් ඇතුළුව අත්කම් සහ සමරු භාණ්ඩ සපයමින් අප හා එක්වූ නිපැයුම්කරුවන්ට මෙහිදී විශේෂ ස්තුතිය පුද කරනු කැමැත්තෙමි. එසේම සෑම අවස්ථාවකම අප ආයතනය මත විශ්වාසය රැඳවූ දේශීය මෙන්ම විදේශීය ගණුදෙනුකරුවෝද අපේ විශේෂ ස්තුතියට හිමිකම් ලබති.

2018 වසර තුළ අලෙවි සහ විකුණුම් තවදුරටත් වර්ධනය කිරීම උදෙසා අවශ්‍ය වන විශේෂඥ සේවා ලබාගනිමින් ආයතනයේ අලෙවිය පුළුල් කිරීමට මම අපේක්ෂා කරමි.

අනාගතයේදී ශ්‍රී ලාංකික ග්‍රාමීය ආර්ථිකය සවිමත් කිරීමට සහ ග්‍රාමීය ප්‍රජාවගේ ජීවන තත්වයන් නගා සිටුවීමට ඇවැසි සියළු පියවර අප ආයතනය මගින් ගනු ලබන බව ප්‍රකාශ කරන අතරම ඉදිරි වසරවලදී අපගේ අලෙවිය රුපියල් බිලියනයක් දක්වා වර්ධනය කිරීමට අපේක්ෂා කරන බවද අවසන් වශයෙන් පවසමි.

2019 වසර තුළ ආයතනයේ අලෙවිය සහ විකුණුම් තවදුරටත් වර්ධනය කරමින් අවශ්‍ය විශේෂඥ සේවා ලබාගනිමින් ආයතනයේ අලෙවිය තවත් ඉහල නැංවීමට මම අපේක්ෂා කරමි.

තවද, ආයතනයේ මානව සම්පත මෙන්ම භෞතික සම්පත්ද ක්‍රමිකව කළමනාකරණය කිරීම හරහා සමස්ත කාර්ය මණ්ඩලයේම කාර්යක්ෂම සහ සඵලදායී දායකත්වය ලබාගනු පිණිස සකසන ලද උපායමාර්ගික සැලසුමකට අනුව ආයතනයේ පොදු කාර්ය පිරිවැය සැලකිය යුතු මට්ටමකින් පහත හෙලමින් 2019 වසර තුළ අප ලාභ ප්‍රතිශතය වර්ධනය වන තත්වයක පවත්වා ගැනීමටද සැලසුම් සකස් කර තිබේ.

සභාපති,
ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය- ලක්සල

# මූල්‍ය ප්‍රකාශ

**ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය**
**විස්තීරණ අදායම පිළිබඳ ප්‍රකාශය - ලක්සල**
**2018 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා**

| | සටහන | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|---|
| ආදායම | 3 | 737,283,033 | 755,425,556 |
| විකුණුම් පිරිවැය | | (306,324,003) | (315,568,451) |
| දළ ලාභය | | **430,959,030** | **439,857,105** |
| ලැබී ඇති ප්‍රදාන | | - | 50,340,000 |
| වෙනත් ආදායම් | 4 | 11,851,544 | 10,650,257 |
| පරිපාලන වියදම් | | (313,643,115) | (349,774,444) |
| බෙදාහැරීමේ වියදම් | | (56,287,682) | (55,789,513) |
| **මෙහෙයුම් කටයුතු වලින් ප්‍රතිඵල** | | **72,879,777** | **95,283,405** |
| මූල්‍ය පිරිවැය | 5 | (51,289,163) | (70,421,241) |
| **බදු පෙර ලාභය** | 6 | **21,590,614** | **24,862,164** |
| බදු | 7 | (5,149,100) | - |
| **වර්ෂය සඳහා ලාභය** | | **16,441,514** | **24,862,164** |

ගිණුම් ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රකාශවල 9 සිට 25 දක්වා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍යම අංගයක් වන්නේ ය. වරහන් තුළ සඳහන් සංඛ්‍යා මගින් අඩු කිරීම් නිරූපණය කරයි.

# ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
## මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය - ලක්සල
2018 දෙසැම්බර් මස 31 වන දිනට

| | සටහන | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ, පිරියත හා උපකරණ | 8 | 993,113,357 | 1,040,666,126 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **993,113,357** | **1,040,666,126** |
| **ජංගම වත්කම්** | | | |
| භාණ්ඩ වට්ටෝරු | 9 | 463,384,277 | 578,948,995 |
| වෙළඳ සහ අනෙකුත් ලැබීම් | 10 | 108,718,915 | 196,464,192 |
| මුදල් හා මුදල් සමාන දෑ | 11 | 24,451,300 | 9,470,676 |
| **මුළු ජංගම වත්කම්** | | **596,554,492** | **784,883,863** |
| **මුළු වත්කම්** | | **1,589,667,849** | **1,825,549,989** |
| **කොටස් හිමිකම් හා බැරකම්** | | | |
| **කොටස් හිමිකම්** | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | | 73,628,878 | 73,628,878 |
| ප්‍රාග්ධන සංචිත | | 510,806 | 510,806 |
| ප්‍රත්‍යාගණන සංචිත | | 454,366,157 | 454,366,157 |
| ලැබී ඇති ප්‍රදාන | | 103,951,172 | 103,951,172 |
| ආදායම් සංචිත වල වෙනත් අංග | 12 | (178,017,763) | (38,180,995) |
| රඳවාගත් ඉපැයුම් | | 5,766,701 | (10,674,813) |
| **මුළු සංචිත** | | **460,205,951** | **583,601,205** |
| **ජංගම නොවන බැරකම්** | | | |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | 13 | 44,191,479 | 38,062,261 |
| විලම්බිත ආදායම | 14 | 100,184,713 | 125,524,713 |
| දිගු කාලීන ණය ගැනුම් | 15 | 164,610,344 | 197,828,391 |
| **මුළු ජංගම නොවන බැරකම්** | | **308,986,536** | **361,415,365** |
| **ජංගම බැරකම්** | | | |
| වෙළඳ සහ අනෙකුත් ගෙවීම් | 16 | 524,046,871 | 552,865,918 |
| ආදායම් බදු ගෙවීම් | 7 | 5,149,100 | - |
| කෙටි කාලීන ණය ගැනුම් | 17 | 275,388,387 | 298,600,257 |
| බැංකු අයිරාව | 18 | 15,891,004 | 29,067,244 |
| **මුළු ජංගම බැරකම්** | | **820,475,362** | **880,533,419** |
| **මුළු බැරකම්** | | **1,129,461,898** | **1,241,948,784** |
| **මුළු කොටස් හිමිකම් සහ බැරකම්** | | **1,589,667,849** | **1,825,549,989** |

ඊ.ඒ. ඩෙලිකන්
**මූල්‍ය අධ්‍යක්ෂ (වැඩ බලන)**

*ගිණුම් ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රකාශවලට සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍යම අංගයක් වන්නේ ය. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කර ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය උසුලයි. 2019 අප්‍රේල් මස 30 වන දින තුම්මුල්ල ලක්සල කාර්යාලයේ දී පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම මූල්‍ය ප්‍රකාශය අනුමත කරන ලද අතර ඔවුන් වෙනුවෙන් ඒ සඳහා පහත අත්සන් තබන ලදී.*

| මධුර ද සිල්වා | ප්‍රදීප් කුමාර | මොහොමඩ් හම්සා |
|---|---|---|
| ප්‍රධාන විධායක නිලධාරී | මණ්ඩල සාමාජික | සභාපති |

ගිණුම් ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රකාශවල 9 සිට 25 දක්වා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි අවශ්‍යම අංගයක් වන්නේ ය. වරහන් තුළ සඳහන් සංඛ්‍යා මගින් අඩු කිරීම් නිරූපණය කරයි.

## ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
## කොටස් හිමිකම් වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය
2018 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය | ප්‍රාග්ධන සංචිත | ප්‍රත්‍යාගණන සංචිත | ප්‍රාග්ධන ප්‍රදාන | රඳවාගත් ඉපැයුම | ආදායම් සංචිත වල වෙනත් අංග | මුළු සංචිත |
|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 2017 ජනවාරි මස 01 වන දිනට ශේෂය | 73,628,878 | 510,806 | 454,366,157 | 103,951,172 | (35,536,977) | (35,648,094) | **561,271,942** |
| වර්ෂය සඳහා ලාභය | - | - | - | - | 24,862,164 | - | **24,862,164** |
| ආදායම් සංචිත වල ගැළපීම් | - | - | - | - | | (2,532,901) | **(2,532,901)** |
| **2017 දෙසැම්බර් මස 31 දිනට ශේෂය** | 73,628,878 | 510,806 | 454,366,157 | 103,951,172 | (10,674,813) | (38,180,995) | **583,601,205** |
| වර්ෂය සඳහා ලාභය | - | - | - | - | 16,441,514 | - | **16,441,514** |
| ආදායම් සංචිත වල ගැළපීම් | - | - | - | - | - | (139,836,768) | **(139,836,768)** |
| **2018 දෙසැම්බර් මස 31 දිනට ශේෂය** | **73,628,878** | **510,806** | **454,366,157** | **103,951,172** | **5,766,701** | **(178,017,763)** | **460,205,951** |

ගිණුම් ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රකාශවල 9 සිට 25 දක්වා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්හී අවශ්‍යම අංගයක් වන්නේ ය. වරහන් තුළ සඳහන් සංඛ්‍යා මගින් අඩු කිරීම් නිරූපණය කරයි.

# ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

## මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

2018 දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා

| | සටහන් | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|---|
| **මෙහෙයුම් කටයුතු වලින් මුදල් ප්‍රවාහ** | | | |
| **බදු වියදමට පසු ලාභය** | | **21,590,614** | **24,862,164** |
| **ගැළපීම් කළා :** | | | |
| ස්වේච්ඡා විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමය සඳහා ක්‍රමක්ෂය අය | | 3,278,092 | 999,909 |
| විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් | | 6,704,212 | 6,467,126 |
| පොලී වියදම් | | 51,289,163 | 70,421,241 |
| ක්ෂය වීම් | | 24,329,921 | 28,398,039 |
| ප්‍රාග්ධන වියදම් පිටිවැය ක්‍රමක්ෂය | | 25,340,000 | 22,960,906 |
| ප්‍රදාන ක්‍රමක්ෂය | | (25,340,000) | (25,340,000) |
| | | **107,192,002** | **128,769,385** |
| **කාරක ප්‍රාග්ධනයෙහි වෙනස්වීම්** | | | |
| භාණ්ඩ වට්ටෝරු | | (16,718,542) | (23,047,843) |
| වෙළඳ හා අනෙකුත් ලැබීම් | | 84,467,185 | (34,396,884) |
| වෙළඳ හා අනෙකුත් ගෙවීම් | | (36,372,557) | 36,574,985 |
| **මෙහෙයුම් කටයුතු වලින් උත්පාදිත මුදල්** | | **138,568,088** | **107,899,643** |
| ස්වේච්ඡා විශ්‍රාම ගැන්වීමේ යෝජනා ක්‍රමය සඳහා ගෙවීම් | | - | (336,725) |
| පාරිතෝෂික ගෙවීම් | | (574,994) | (2,392,846) |
| පොලී ගෙවීම් | | (51,289,163) | (70,879,660) |
| **මෙහෙයුම් කටයුතු වලින් උත්පාදිත ශුද්ධ මුදල්** | | **86,703,931** | **34,290,412** |
| **ආයෝජන කටයුතු වලින් මුදල් ප්‍රවාහ** | | | |
| දේපළ, පිරියත හා උපකරණ මිලදී ගැනීම | | (2,117,152) | (5,218,310) |
| **ආයෝජන කාර්යයන් තුළ භාවිත කළ ශුද්ධ මුදල් ප්‍රවාහ** | | **(2,117,152)** | **(5,218,310)** |
| **මූල්‍ය කටයුතු වලින් මුදල් ප්‍රවාහ** | | | |
| ලබා ගත් දිගු කාලීන ණය | | 15,824,872 | 68,208,925 |
| ණය ආපසු ගෙවීම | | (72,254,789) | (116,408,626) |
| **මූල්‍ය කාර්යයන් තුළ භාවිත කළ ශුද්ධ මුදල් ප්‍රවාහ** | | **(56,429,917)** | **(48,199,701)** |
| **මුදල් හා මුදල් සාමාන්‍යයන්හී ශුද්ධ වැඩිවීම /(අඩුවීම)** | | **28,156,862** | **(19,127,599)** |
| වසර ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ | | (19,596,566) | (468,967) |
| **වසර අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ** | | **8,560,296** | **(19,596,566)** |
| බැංකු අයිරාව | **18** | (15,891,004) | (29,067,244) |
| අතැති සහ බැංකුවේ ඇති මුදල් | **11** | 24,451,300 | 9,470,678 |
| | | **8,560,296** | **(19,596,566)** |

ගිණුම් ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රකාශවල 9 සිට 25 දක්වා වන සටහන් මෙම මූල්‍ය ප්‍රකාශයන්හී අවශ්‍යම අංගයක් වන්නේ ය. වරහන් තුළ සඳහන් සංඛ්‍යා මගින් අඩු කිරීම් නිරූපණය කරයි.

# ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
# මූල්‍ය ප්‍රකාශවලට සටහන්

## 1.ආයතනික තොරතුරු

### 1.0 සමාගම

ලක්සල යන වෙළඳ නාමය යටතේ ජනප්‍රියත්වය ලැබ ක්‍රියාත්මක වන ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල) ශ්‍රී ලංකාව පුරා නිපදවනු ලබන අත්කම් භාණ්ඩ අලෙවි කිරීමේ කටයුතුවල යෙදෙන රජය සතු එකම ආයතනයයි.

### 1.1 ප්‍රධාන කටයුතු හා මෙහෙයුම් ස්වභාවය

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ මූලික කටයුතු වනුයේ දේශීය හා විදේශීය වෙළෙඳපොළට ත්‍යාග සහ සැමරුම් භාණ්ඩ අලෙවි කිරීමයි.

## 2.පොදු ගිණුම් ප්‍රතිපත්ති

### 2.0 මානනයේ පදනම

2018 දෙසැම්බර් මස 31 දිනට අවසන් වූ වර්ෂය සඳහා මණ්ඩලයේ ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් ද (මූල්‍ය ප්‍රකාශය) ඇතුළුව එහි මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, විස්තීර්ණ අදායම් ප්‍රකාශ, කොටස් ආයෝජනයන්හී වෙනස්කම් පිළිබඳ ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කරනු ලබන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සකසා ඇත.

සාධාරණ අගය අනුව මානනය කරනු ලබන මූල්‍ය වත්කම් හා බැරකම් සඳහා හැරුනු විට මූල්‍ය ප්‍රකාශ ඓතිහාසික පිරිවැය මත පදනම්ව පිළියෙල කරනු ලැබ ඇත. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සඳහා ඇතැම් නිශ්චයාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු උපයෝගී කර ගැනීම අවශ්‍ය වේ. සියලුම මුදල් අගයන් ශ්‍රී ලංකා රුපියල් වටිනාකම අනුව ඉදිරිපත් කරනු ලැබේ.

### 2.1 ඇස්තමේන්තු, උපකල්පන හා නිගමන යොදා ගැනීම

ප්‍රතිපත්ති යොදා ගැනීම කෙරෙහි හා වත්කම්, බැරකම්, ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා වූ ගණන් ප්‍රමාණ කෙරෙහි බලපැවැත්විය හැකි නිගමනවලට, ඇස්තමේන්තුවලට හා උපකල්පනයන්ට එළඹීම පිණිස කළමනාකරණයට අවශ්‍ය වන්නා වූ ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිති සමඟ සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ විධි ක්‍රමය සමග මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සාරානුකූල වේ. මෙම ඇස්තමේන්තු සහ උපකල්පනයන් පැවති වාතාවරණ යටතේ සාධාරණ යයි විශ්වාස කෙරෙන ඓතිහාසික අත්දැකීම් සහ වෙනත් විවිධ සාධක මත පදනම් වේ. එහි ප්‍රතිඵල සෙසු මූලාශ්‍රයන්ගෙන් පැහැදිලිවම වෙනස් නොවන වත්කම් හා වගකීම් හි ඉදිරියට ගෙනයාමේ අගයන් මත තීරණ ගැනීමේ පදනම සැකසේ. තථ්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තු වලින් වෙනස් විය හැකිය. ඇස්තමේන්තු සහ විශේෂ උපකල්පනයන් පවත්නා පදනම මත සමාලෝචනයට බඳුන් කෙරේ. ඇස්තමේන්තු ගිණුම්ගත කිරීමේ සංශෝධනයන් ඇස්තමේන්තු සංශෝධනය කරන අවස්ථාවේ දී හඳුනාගනු ලබනු ඇත. එසේ කරනු ලබන්නේ එම සංශෝධනය එම කාලයට හෝ සංශෝධනය කරන කාලයට සහ අනාගත කාල පරිච්ඡේදයනට පමණක් බලපාන්නේ නම් සහ සංශෝධනය වර්තමාන සහ අනාගත යන කාල පරිච්ඡේදයන් දෙකට ම බලපාන්නේ නම් පමණි.

### 2.2 අඛණ්ඩ පැවැත්ම

මූල්‍ය ප්‍රකාශ පිලියෙළ කිරීමේ දී ඉදිරි අනාගතයේ අඛණ්ඩ පැවැත්ම තවදුරටත් පවත්වාගෙන යාමෙහි ලා සංවිධානයේ වත්කම් තක්සේරුවක් අප විසින් සිදුකර ඇත. අනාගතය පිළිබඳව පවත්නා සියලු තොරතුරු සැලකිල්ලට ගැනීමේ දී වෙළෙඳාම ඈවර කිරීම හෝ අවසන් කිරීම පිළිබඳව අවශ්‍යතාවයක් පුරෝකථනය නොකරමු.

## 2.3 සංසන්දනාත්මක තොරතුරු

සමාගම විසින් ගිණුම්කරණ ප්‍රතිපත්ති සමානුකූල අයුරින් යොදා ගනු ලැබ ඇති අතර ඉකුත් වසරේ භාවිත ප්‍රතිපත්තිවලට ද සාරානුකූල වේ. ඒවා සාධාරණව ඉදිරිපත් කරනු ලැබීම සඳහා අවශ්‍ය අවස්ථාවලදී ප්‍රතිවර්ගීකරණය කරනු ද ලැබ තිබේ.

## 2.4 සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සාරාංශය

පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති මෙම මුල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරනු ලබන සෑම කාල පරිච්ඡේදයක් සඳහා ම අනුකූල වන පරිදි මණ්ඩලය විසින් අදාළ කරගනු ලැබ සුසංගතව යොදා ගනු ලැබ තිබේ.

### 2.4.1 ආදායම හඳුනාගැනීම

ආදායම හඳුනා ගැනෙනුයේ එමඟින් ආර්ථික ප්‍රතිලාභ ව්‍යාපාරික ආයතනය වෙත ගලා එතැයි අනුමාන කෙරෙන හා එම ආදායම විශ්වාසදායක ලෙස මානනය කළ හැකිතාක් දුරකටය. ලද හෝ ලැබීමට නියමිත මුදල් ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගය මත ආදයම මානනය කෙරේ. එසේ නැතහොත් එය වෙළඳ වට්ටම් හා අදාළ බදු රහිත ලැබීම් නියමිත වශයෙන් ගණනය කෙරේ.

විදේශ ව්‍යවහාර මුදල් අනුසාරයෙන් සිදුවන ගනුදෙණු එම ගනුදෙණු සිදුවන කාලයේ පවතින එකී ගනුදෙණු පාලනය වන විදේශ විනිමය අනුපාතිකය යටතේ පරිවර්තනය කරනු ලැබේ.

ශේෂ පත්‍ර දිනයේදී විදේශ ව්‍යවහාර මුදලින් වර්ගීකරණය කරනු ලබන මූල්‍ය වත්කම් හා වගකීම් එලෙස වර්ගීකරණය කරනු ලබන මූල්‍ය වත්කම් හා වගකීම් සම්බන්ධයෙන් එදිනට පාලනය වන්නා වූ විදේශ විනිමය අනුපාතිකය යටතේ ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ලැබේ.

### 2.4.2 දේපළ, පිරියත සහ උපකරණ

(අ) හඳුනා ගැනීම සහ මානනය කිරීම

දේපළ පිරියත හා උපකරණ හඳුනා ගැනීමේ පදනම පිළිගැනෙනුයේ, වත්කම් ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගම වෙත ගලා එතැයි අනුමාන කරනු ලබන්නේ නම් හා වත්කමෙහි පිරිවැය විශ්වාසනීය ලෙස මානනය කළ හැකි නම් ය.

ඉඩම් හැර දේපළ, පිරියත සහ උපකරණ, සමුච්චිත ක්ෂය සහ සමුච්චිත දුබලතා අලාභ අඩුකළ පිරිවැය අගයට සඳහන් කර ඇත. වත්කම් අත්කර ගැනීම කෙරෙහි සෘජුව ආරෝපණය කළ හැකි වියදම් පිරිවැය තුළ අන්තර්ගත වේ. පිරිවැය ද්‍රව්‍ය, සෘජු, ශ්‍රමය හා ස්වකීය අපේක්ෂිත පරිහරණය සඳහා කිසියම් සාධ්‍ය තත්ත්වයකට වත්කම් රැගෙන යාම පිණිස සෘජුව ආරෝපණය කළ හැකි වෙනත් යම් පිරිවැය සහ එකී වත්කම් ස්ථානගත කර ඇති වැඩ බිමෙහි පවත්නා ද්‍රව්‍ය කිසිවක් ගලවා කොටස් කිරීමේ හා ඒවා ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය, ස්වයං නිර්මිත වත්කම් තුළ අන්තර්ගත වේ. දේපළ, පිරියත හා උපකරණ යනාදියට අයත් යම් අයිතමයක් එකිනෙකට වෙනස් ප්‍රයෝජ්‍ය ආයු කාල සහිතව ප්‍රධාන අංගෝපාංග කිසිවකින් සමන්විත වන විට දී, ඒවා වෙනම දේපළ, පිරියත සහ උපකරණ අයිතමයන් ලෙස ගණනය කෙරේ.
දේපළ, පිරියත හා උපකරණ වල ඉදිරියට ගෙනයන අගය යම් සිදුවීම් හෝ අවස්ථානුගත කරුණු වල වෙනස්කම් අනුව නැවත අයකරගත නොහැකි බව විද්‍යාමාන වන අවස්ථාවන්හි දී එකී දේපළ, පිරියත හා උපකරණ වල ඉදිරියට ගෙනයන අගය දුබලතා සඳහා සමාලෝචනයට හසු කෙරේ.

දේපළ, පිරියත හා උපකරණ ව්‍යපහරණය මත අත්වන ඕනෑම ලාභයක් හෝ අලාභයක්, එකී දේපළ, පිරියත හා උපකරණවලට අදාළ ඉදිරියට ගෙනයන වටිනාකම සහ එහි ව්‍යපහරණය මත ලද මුදල් ප්‍රමාණය සමඟ සසඳනු ලැබීමෙන් නිශ්චය කරනු ලබන අතර ඒවා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය යටතේ හඳුනා ගනු ලැබේ.

(ආ) ක්ෂයවීම්

ක්ෂයවීම් වෙනුවෙන් ප්‍රතිපාදන ගණනය කෙරෙනුයේ, අදාළ ගණන් ප්‍රමාණ ඒවායේ ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලය මුළුල්ලේ කපා හැරීමේ අරමුණ ඇතිව සින්නක්කර ඉඩම් හැර අනෙකුත් සියලු දේපළ, පිරියත හා උපකරණ යනාදියෙහි පිරිවැය මත සරල රේඛීය මාර්ග ක්‍රමය භාවිතයට ගනිමිනි.

යොදාගන්නා ලද ප්‍රධාන වාර්ෂික අනුපාත ප්‍රමාණයන් පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| 1. ගොඩනැගිලි | 2.5% |
| 2. යන්ත්‍ර සහ උපකරණ | 10% |
| 3. වට්ටෝරුගත භාණ්ඩ | 10% |
| 4. ගෘහ භාණ්ඩ සහ සවිකිරීම් | 10% |
| 5. පරිගණක දෘඩාංග හා මෘදුකාංග | 20% |

(ඇ) දේපළ, පිරියත හා උපකරණ විකිණීමෙන් උද්ගත වූ ලාභ/අලාභ

දේපළ, පිරියත හා උපකරණ විසුම් ගැන්වීම හෝ ව්‍යපහරණය කිරීම මත උද්ගතවන ලාභ හෝ අලාභ අදාළ විකුණුම් සිදුවන කාල පරිච්ඡේදයන්හි දී හඳුනා ගනු ලබන අතර වෙනත් මෙහෙයුම් ආදායම් යටතේ වර්ගීකරණය කරනු ලැබේ.

### 2.4.3 කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන වැඩ

ශේෂ පත්‍රයේ දිනට වර්ෂය තුළ සම්පූර්ණ කරනු නොලබන ප්‍රාග්ධන වියදම් අත්තිකාරම් ගෙවීම් ලෙස සඳහන් කෙරෙන අතර වර්ෂය තුළ නිම කරනු ලැබ භාවිතයට යොදා ගැනුනු ප්‍රාග්ධන වත්කම් දේපළ, පිරියත හා උපකරණ වෙත මාරු කෙරේ.

### 2.4.4 අස්පෘශ්‍ය වත්කම්

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය විසින් අත්කර ගනු ලැබූ ප්‍රයෝජ්‍ය අත්‍යන්ත ආයු කාලයක් සහිත අස්පෘශ්‍ය වත්කම්, සමුච්චිත ක්‍රමක්ෂය හා සමුච්චිත දුබලතා අලාභ ඌණ පිරිවැය මත මානනය කරනු ලැබේ.

(අ) හඳුනා ගැනීමේ පදනම

අස්පෘශ්‍ය වත්කමක් හඳුනා ගනු ලබනුයේ, වත්කම්වලට අරෝපණය කළ හැකි අනාගත ආර්ථික ප්‍රතිලාභ ව්‍යාපාරික ආයතනය වෙත ගලා එතැයි යනුවෙන් හා අදාළ පිරිවැය සමුච්චිත දුබලතා, අලාභ ඌණ පිරිවැය මත විශ්වසනීය ලෙස මානනය කර ඉදිරියට ගෙනගිය හැකි වෙතැයි යනුවෙන් අනුමාන වන්නා වූ අවස්ථාවන්හිදී ය.

(ආ) පසු කාලීන වියදම්

පසු කාලීන වියදම් හා සම්බන්ධ නිශ්චිත වත්කම්වල අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ ඉහළ යන අවස්ථාවන්හි දී පමණක් අදාළ පසු කාලීන වියදම් ප්‍රාග්ධනිත කෙරේ. අභ්‍යන්තරික වශයෙන් ජනනය වන කීර්ති නාමයට හා සන්නාමයට අදාළ වියදම් ද ඇතුළු සෙසු සියලු වියදම්, ඒවා දරනු ලැබ ඇතැයි යනුවෙන් සලකා ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

(ඇ) විසුම් ගැන්වීම හා ව්‍යපහරණය

අස්පෘශ්‍ය වත්කම් ඒවා ව්‍යපහරණය කිරීම මත හෝ එහි භාවිතයෙන් පසුව ව්‍යපහරණය කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභයක් ලැබෙතැයි අපේක්ෂා නොකරන විට අස්පෘශ්‍ය වත්කම් සේ හඳුනා නොගැනේ.

(ඈ) ක්‍රමක්ෂය කිරීම

අස්පෘශ්‍ය වත්කම්, ඒවා භාවිතය පිණිස පවත්නා දිනයේ සිට ඒවායේ ඇස්තමේන්තුගත ප්‍රයෝජ්‍ය ආයු කාලය මුළුල්ලේ සරල මාර්ග රේඛීය ක්‍රමය අනුව ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගනු ලැබේ.

### 2.4.5 දුබලතා

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය සතු වත්කම්හි ඉදිරියට ගෙන යන ගණන් ප්‍රමාණ, කිසියම් වත්කමක දුබලතා ලක්ෂණ පෙන්වන්නේදැයි නිශ්චය කරනු පිණිස එක් එක් ශේෂ පත්‍ර දිනයේදී සමාලෝචනයට හසු කෙරේ. එවැනි දුබලතා ලක්ෂණ විද්‍යාමාන වන්නේ නම්, අදාළ වත්කමෙහි ආපසු අයකරගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ. යම් දුබලතා අලාභයක් හඳුනා ගැනෙනුයේ, කිසියම් වත්කමක ධාරණ අගය හෝ එහි මුදල් උත්පාදන ඒකකය ආපසු අයකරගත හැකි වටිනාකම ඉක්මවන අවස්ථාවකදී ය. දුබලතා අලාභ ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගැනේ.

### 2.4.6 වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු දෑ

වෙළෙඳ ලැබිය යුතු දෑ වනුයේ, සාමාන්‍ය ව්‍යාපාරික කාලය තුළ ගනුදෙනුකරුවන් වෙත අලෙවි කරන ලද භාණ්ඩ සඳහා හෝ ඔවුන් වෙනුවෙන් ඉටු කරන ලද සේවා සඳහා ලැබීමට නියමිතව පවතින්නා වූ මුදල් ගණන් ප්‍රමාණයෝයි. ඒවා එකතු කර ගැනීමේ කාලය වසරකට හෝ ඊට වඩා අඩු වෙතැයි අපේක්ෂා කරන්නේ නම්, (සාමාන්‍ය ව්‍යාපාර මෙහෙයුම් කටයුතු චක්‍රය තුළ ඊටත් වඩා දිගු වන්නේ නම් හෝ) ඒවා වර්ගීකරණය කරනු ලබන්නේ ජංගම වත්කම් වශයෙනි. එසේ නොවන්නේ නම්, ඒවා ඉදිරිපත් කරනු ලබනුයේ ජංගම නොවන වත්කම් ලෙස ය.

### 2.4.7 භාණ්ඩ වට්ටෝරු

අභාවිත සහ අලුත්වැඩියා කළ හැකි අයිතමයන් සඳහා ප්‍රතිපාදන සැලැස්වීමෙන් පසුව, භාණ්ඩ ලැයිස්තු ඒවායේ පිරිවැය අගය සහ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකෙන් අඩු අගයට අගය කරනු ලැබේ. පිරිවැය නිශ්චය කරනු ලබන්නේ බර තැබූ සාමාන්‍ය පිරිවැය ක්‍රමයට අනුව ය. ශුද්ධ උපලබ්ධි අගය වන්නේ සාමාන්‍ය ව්‍යාපාරික කාලය තුළ බඩු ලැයිස්තු විකිණිය හැකි මිල වන අතර හානියට පත් තොග සහ අලුත්වැඩියා තොග, තොග උපලේඛනය යටතේ දැක්වේ.

### 2.4.8 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාර්යයන් සඳහා මුදල් වටිනාකම දැන ගැනීමට පහසුවෙන් පරිවර්තනය කළ හැකි කෙටි කාලීන ඉහළ ද්‍රවශීලතාවයකින් යුතු ආයෝජන අත ඉතිරි මුදල් හා මුදල් සමාන දෑ ලෙස නිර්වචනය කෙරේ. මුදල් හා මුදල් සමාන දෑ යන්නෙහි අත ඉතිරි මුදල් සහ බැංකු අයිරා හැර වෙනත් මුදල්, කෙටි කාලීන ණය ගැනුම් හා කෙටි කාලීන ආයෝජන අන්තර්ගත වේ.

### 2.4.9 මුදල් ප්‍රවාහ ප්‍රකාශ

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති LKAS 07 (මුදල් ප්‍රවාහ ප්‍රකාශ) අනුකූලව වක්‍ර ක්‍රමය භාවිතයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිලියෙළ කර ඇත.

### 2.4.10 සේවා නියුක්තිකයන්ගේ ප්‍රතිලාභ

(අ) නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම- විශ්‍රාමික පාරිතෝෂික

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ විශ්‍රාමික ප්‍රතිලාභ බැදීම් සඳහා වන 2018 වර්ෂය තුළ බැඳියාව, සංවිධානයේ සේවා නියුක්තයන් 135 දෙනෙකු ආවරණය වන නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මකි. මෙම බැඳියාව සපුරාලීම පිණිස පළමු සේවා වර්ෂයේ සිට ආරම්භ වන එක් එක් සම්පූර්ණ සේවා වර්ෂය සඳහා සියළුම සේවා නියුක්තයන්ගේ මූල්‍ය වර්ෂයේ අවසන් මස අර්ධ මාසික වැටුප මත පදනම්ව ගණනය කරන ලද වටිනාකමට සමාන අගයකට ශේෂ පත්‍රයේ ප්‍රතිපාදනයක් ඉදිරියට ගෙන යනු ලැබේ. වර්ෂය ආරම්භයේ දී ඉදිරියට රැගෙන ආ ප්‍රතිපාදන සහ වර්ෂය අවසානයේ ඉදිරියට රැගෙන ගිය ප්‍රතිපාදන අතර ඇතිවන වෙනසෙහි අඩුව සම්බන්ධයෙන් ආදායම් ප්‍රකාශයේ දී කටයුතු කරනු ලැබේ.

**(ආ) නිශ්චිත දායකත්ව සැලැස්ම**

සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල අදාළ ව්‍යවස්ථා සහ රෙගුලාසිවලට අනුකූලව සේවා නියුක්තිකයන් සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා සුදුසුකම් ලබයි. සේවා නියුක්තිකයින්ගේ දළ පඩිනඩි මත 12% ක් හා ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය විසින් 3% ක් වන පරිදි පිලිවෙළින් සේවක අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා දායකත්වය ලබා දේ.

**2.4.11 ණය ගැනුම්**

ණය ගැනුම් මූලික වශයෙන් හඳුනා ගැනෙනුයේ, දරන ලද ගනුදෙනුවල වියදම් රහිත සාධාරණ අගය මතය. පසුව වීළඹෙන කාල තුළ, සථල පොලී ක්‍රමය යොදා ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය මත ණය ගැනුම් සඳහන් කෙරේ. ලත් මුදල් (ගනුදෙනුවල වියදම් රහිත) හා නිදහස්කර ගැනීමේ අගය අතර පවතින්නා වූ යම් වෙනසක් වේ නම්, එය, ණය ගැනුම් කාල සමය මුළුල්ලේ ආදායම් ප්‍රකාශය තුළ හඳුනා ගැනේ.

**2.4.12 බැරකම් හා ප්‍රතිපාදන**

අතීත සිදුවීම්වල ප්‍රතිඵලයක් ලෙස නෛතික /සම්ප්‍රයුක්ත බැඳීමක් වර්තමානයේ පවතින විට බැරකම් හා ප්‍රතිපාදන ශේෂ පත්‍රය තුළ හඳුනා ගැනේ. එකී බැඳීම්වල නිරවුල් කිරීම තුළින් ආර්ථික ප්‍රතිලාභ අන්තර්ගත සම්පත් විගලනයක් උද්ගත වෙතැයි අපේක්ෂා කෙරේ. ණය හිමියා විසින් කරනු ලබන ඉල්ලීමකදී හෝ ශේෂ පත්‍රයේ දිනට වසරක් ඇතුළත දී හෝ ගෙවිය යුතු වන්නා වූ බැඳීම් ශේෂ පත්‍රය තුළ ප්‍රවර්තන බැරකම් ලෙස සලකනු ලැබේ. ශේෂ පත්‍රයේ දිනයේ සිට එක් වසරකට පසුව ගෙවිය යුතු බැරකම් ශේෂ පත්‍රය තුළ ප්‍රවර්තන නොවන බැරකම් ලෙස සැලකේ.

**(අ) වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු දෑ**

වෙළෙඳ ගෙවිය යුතු දෑ වනුයේ, සාමාන්‍ය ව්‍යාපාරික කාලය තුළ සැපයුම්කරුවන් වෙත භාණ්ඩ සඳහා හෝ ඔවුන් වෙතින් ලබා ගත් සේවා වෙනුවෙන් ගෙවීමට නියමිතව පවතින්නා වූ බැඳීම් සඳහා වන මුදල් ගණන් ප්‍රමාණයෝයි. ඒවා ගෙවිය යුතු වන්නා වූ කාලය වසරකට හෝ ඊට වඩා අඩු වන්නේ නම්, (සාමාන්‍ය ව්‍යාපාර මෙහෙයුම් කටයුතු චක්‍රය තුළ ඊටත් වඩා දිගු වන්නේ නම් හෝ) එසේ ගෙවිය යුතු ගිණුම්වර්ගීකරණය කරනු ලබන්නේ ජංගම බැරකම් වශයෙනි. එසේ නොවන්නේ නම්, ඒවා ඉදිරිපත් කරනු ලබනුයේ ජංගම නොවන බැරකම් ලෙස ය.

ප්‍රේෂණ තොග ඇතුළු සියලු මිලදී ගැනීම් සඳහා භාණ්ඩ ලැබීම් සටහන් තබන අවස්ථාවේ දී ගිණුම් පොත්හි බැරකම් වාර්තා කිරීමේ ප්‍රතිපත්තිය ලක්සල ආයතනය විසින් පිළිපදිනු ලැබ තිබුණි. එසේ වුව ද, ප්‍රේෂණ ණය හිමියන් වෙත ගෙවීම් සිදු කෙරෙනුයේ අදාළ ප්‍රේෂණ තොග විකුණනු ලබමින් පවත්නා අවස්ථාවේ දී පමණි.

**2.4.13 ආදායම් බදු**

ප්‍රවර්තන ආදායම් බදු අය ගණනය කරනු ලබන්නේ සමාගම විසින් බදු වන ආදායම් මෙහෙයවා උත්පාදනය කරනු ලබන අවස්ථාවේ දී සමාගමේ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දිනට රට තුළ පනවා ඇති හෝ ප්‍රමාණවත් පරිදි පනවනු ලබන බදු අණ පනත් මත පදනම්ව ය. යොදා ගත යුතු බදු රෙගුලාසි වල නිර්වචනයට යටත් වන තත්ත්වයන්ට අදාළව බදු වාර්තා සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියා මාර්ගය කළමනාකරණය විසින් වාරමය වශයෙන් අගැයුමට ලක් කරනු ලබන අතර බදු බලධරයන් වෙත ගෙවිය යුතු යැයි අපේක්ෂිත මුදල් ප්‍රමාණ පදනම මත පිහිටා අදාළ වන පරිදි වන්නා වූ ප්‍රතිපාදන ද පිහිටුවනු ලබයි.

**2.4.14 ආදායම හඳුනා ගැනීම**

ආදායම හඳුනා ගැනෙනුයේ භාණ්ඩ විකිණීම සඳහා ලද ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගය දක්වා වූ ද ආර්ථික ප්‍රතිලාභ ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය වෙත ගලා එතැයි අනුමාන කරන්නා වූ ද ආදායම සහ දරන ලද හෝ දරනු ලැබීමට නියමිත ආශ්‍රිත පිරිවැය විශ්වාසනීය ලෙස මානනය කළ හැකි වන්නාවූ ද දුරකටය. ආදායම මානනය කරනුයේ, වෙළඳ වට්ටම්, ප්‍රතිලාභ, ප්‍රතිදාන සහ අදාළ බදු හැර ලද හෝ ලැබීමට නියමිත දෑ සලකා බැලීම මගිනි. ආදායම හඳුනා ගනු පිණිස පහත දැක්වෙන් නිශ්චිත නිර්ණායක ද සපුරාලිය යුතු වන්නේ ය.

**භාණ්ඩ විකුණුම්**

භාණ්ඩ විකිණීමෙන් ලැබෙන ආදායම, ලද හෝ ලැබිය යුතු ශුද්ධ ප්‍රතිලාභ, වෙළඳ වට්ටම් සහ ධාරිතා ප්‍රතිදාන ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගයට මනිනු ලැබේ. සුවිශේෂී අවදානම් සහ හිමිකාරිත්ව ප්‍රතිලාභ මිලදී ගන්නා වෙත පවරනු ලැබ ඇති විට, ප්‍රතිෂ්ඨාව අයකර ගැනීම සිදුවිය හැකි විට, ආශ්‍රිත පිරිවැය සහ සිදුවිය හැකි භාණ්ඩ ආපසු පැමිණීම් වාර්තා විශ්වාසනීය ලෙස ඇස්තමේන්තු ගත කළ හැකි අවස්ථාවක සහ භාණ්ඩ සම්බන්ධයෙන් අඛණ්ඩ කළමනාකරණ මැදිහත්වීමක් නොමැති විට ආදායම හඳුනා ගනී. අවදානම් සහ ප්‍රතිලාභ පැවරීම විකුණුම් කොන්ත්‍රාත්තුවේ එක් එක් කොන්දේසි මත රඳා පවතිමින් වෙනස් වේ.

**වෙනත් මෙහෙයුම් ආදායම්**

(අ) දේපළ, පිරියත හා උපකරණ විකිණීමෙන් උද්ගත වන ලාභ හා අලාභ

(ආ) දේපළ, පිරියත හා උපකරණ විසුම් ගැන්වීම හෝ ව්‍යපහරණය කිරීම මත උද්ගතවන යම් ලාභ හෝ අලාභ අදාළ විකුණුම් සිදුවන කාල පරිච්ඡේදය තුළ හඳුනා ගනු ලබන අතර වෙනත් මෙහෙයුම් ආදායම් ලෙස වර්ගීකරණය කෙරේ.

**ලද ප්‍රදාන**

රජය විසින් දෙනු ලබන ප්‍රදානය වියදම් විෂයාංගයකට අදාළ වන්නේ නම්, එය හඳුනා ගැනෙනුයේ, පිරිවැය ගලපා ගැනීම සඳහා අවැසි කාල පරිච්ඡේදය මුළුල්ලේ හානි පූර්ණය කෙරෙතැයි යනුවෙන් ගණනය වන ආදායමක් ලෙස ය. අදාළ ප්‍රදානය වත්කමක් හා සම්බන්ධ වන්නේ නම් සාධාරණ අගය විලම්බිත ආදායම් ගිණුමට බැර කර අදාළ වත්කමෙහි අපේක්ෂිත ප්‍රයෝජ්‍ය ආයු කාලය මුළුල්ලේ සමාන වාර්ෂික වාරික ප්‍රමාණ මගින් ආදායම් ප්‍රකාශය වෙත මුදා හැරේ.

**ලද ප්‍රාග්ධන ප්‍රදාන**

ලද ප්‍රාග්ධන ප්‍රදාන විලම්බිත ආදායම් ලෙස හඳුනා ගනු ලැබ ඇති අතර වසර 10 ක කාල පරිච්ඡේදයක් මුළුල්ලේ ක්‍රමක්ෂය කර ඇත.

ලද පුනරාවර්තන ප්‍රදාන

ආදායම හා අදාළ වන්නා වූ ප්‍රදාන වෙනත් ආදායම් ලෙස වෙන් වශයෙන් වාර්තා කිරීමට හෝ අදාළ ආදායම් වෙතින් අවකරණය කිරීමට හෝ පුලුවන.

**2.4.15 වියදම් හඳුනා ගැනීම**

මූල්‍ය ප්‍රකාශය තුළ වියදම් හඳුනා ගැනෙනුයේ දරන ලද පිරිවැය හා නිශ්චිත ආදායම් විෂයාංග වල ඉපැයීම් අතර සෘජු සම්බන්ධතාවක පදනම මත පිහිටා ය. කාර්යක්ෂම තත්වයකින් ව්‍යාපාරය පවත්වාගෙන යෑමේදී ත්, දේපළ පිරියත හා උපකරණ නඩත්තු කිරීමේදී ත් දරනු ලබන සියලු වියදම් ආදායම් ප්‍රකාශයෙහි අයගත කරනු ලැබ තිබේ.

ආදායම් ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා සමාගමේ සහ සමූහයේ කාර්යසාධනයට අයත් මූලාංග වීමගින් සාධාරණ ලෙස නිරූපණය වෙතැයි යන පදනම මත පිහිටා වියදම්හි කාර්යය ක්‍රමය අනුගමනය කර ඇත.

**(අ) අයහාර වියදම්**

ආදායම් ප්‍රකාශයේ දක්වා ඇති පරිදි මණ්ඩලය විසින් උපයනු ලබන ලාභය වනුයේ, සියලු දන්නා බැරකම් සඳහා සහ දේපළ, පිරියත හා උපකරණ වල්ලේ ක්ෂය කිරීම් සඳහා ප්‍රතිපාදන සැලසීමෙන් පසුව ඉතිරිවන මුදලයි.

**(ආ) ප්‍රාග්ධන වියදම්**

ව්‍යාපාරික කටයුතු පවත්වාගෙන යාම සඳහා හෝ ව්‍යාපාරයේ ඉපයීමේ ධාරිතාව ඉහළ නැංවීම උදෙසා ස්ථාවර ස්වරූපයක් ගත් වත්කම් පුළුල් කිරීමේ හෝ වැඩි දියුණු කිරීමේ කාර්යයන් සඳහා දරන ලද වියදම් ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබ ඇත.

දේපළ, පිරියත හා උපකරණ ව්‍යපහරණය මත උද්ගත වන ආදායම් ස්වරූපයේ ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශය තුළ ගණනය කරනු ලැබ ඇත.

**(ඇ) විලම්බිත අයභාර වියදම්**

මණ්ඩලය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාදමයේ කොටසක් ලෙස සමාලෝචිත වසර තුළ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 10 (PED 10) යටතේ ස්වේච්ඡාවෙන් විශ්‍රාම යාම සඳහා සේවක සේවිකාවන් 20 දෙනෙකු සිය මනාපය ප්‍රකාශ කරන ලද අතර ඒ සඳහා රු.10,432,332.25 ක මුදලක් වැයවී ඇත. මෙම පිරිවැය ශේෂ සේවා කාලය තුළ විහිදුවා හැරීම සඳහා වූ ගිණුම් ප්‍රතිපත්තියක් අනුගමනය කෙරිණි. ඒ අනුව, එක් එක් සේවකයා වෙනුවෙන් දරන ලද වියදම සමාන පදනමක් මත ඔවුන්ගේ ශේෂ සේවා කාලය තුළ විහිදුවා හැරේ.

### 2.4.16 ණය ගැනුම් පිරිවැය

ණය මුදල් ගැනුම් පිරිවැය ඒවා දරනු ලබන වර්ෂයේ වියදමක් ලෙස හඳුනා ගනු ලැබේ.

### 2.4.17 බැඳීම් සහ අවිනිශ්චිතතා

මණ්ඩලයේ පාලනයෙන් පරිබාහිර අතීත සිදුවීමක් හේතුවෙන් උද්ගතවන්නාවූ සහ අවිනිශ්චිත අනාගත සිදුවීම් සිදුවීම හෝ සිදු නොවීම මත පමණක් ස්ථිර වන්නා වූ විභව්‍ය වත්කම් හා බැඳීම් අවිනිශ්චිතතා වන්නේ ය.

### 2.4.18 ශේෂ පත්‍රයේ දිනට පසුව පැන නගින සිදුවීම්

ශේෂ පත්‍ර දිනයෙන් අනතුරුව උද්ගත වන සියලුම සැලකිය යුතු සිදුවීම්, ඒවා අදාළ වන අවස්ථාවේදී හෙළිදරව් කර ගළපා ඇතැයි යනුවෙන් සලකා ඇත.

# ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
**මූල්‍ය ප්‍රකාශවලට සටහන්**

| 3. ආදායම | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|
| ප්‍රදර්ශනාගාර විකුණුම් | | |
| තුම්මුල්ල | 314,092,034 | 326,117,671 |
| කෞතුකාගාරය | 93,089,687 | 77,726,202 |
| ගාල්ල | 67,105,575 | 59,482,530 |
| පේරාදෙනිය | 62,476,801 | 69,474,446 |
| කටුනායක | 42,980,562 | 54,935,264 |
| කොටුව | 27,723,597 | 25,334,213 |
| වැලිපැන්න - 1 | 26,942,621 | 20,923,586 |
| බත්තරමුල්ල | 21,321,945 | 22,398,837 |
| මහනුවර | 20,912,924 | 21,032,749 |
| කටුබැද්ද | 16,061,827 | 17,418,404 |
| පින්නවල | 14,247,433 | 13,665,475 |
| විශේෂ සන්නාම | 11,993,455 | 6,453,803 |
| රේස් කෝස් | 3,859,365 | 10,502,420 |
| නුවරඑළිය | 847,604 | - |
| **මුළු ප්‍රදර්ශනාගාර විකුණුම්** | 723,655,430 | 725,465,600 |
| සෘජු / සේවාලාභී රුචිකත්වය මත කළ ඇණවුම් | 17,855,513 | 36,137,275 |
| | **741,510,943** | **761,602,875** |
| ජාතිය ගොඩනැගීමේ බද්ද | (4,227,910) | (6,177,319) |
| | **737,283,033** | **755,425,556** |

රේස් කෝස් ශාඛාව විසින් නොකඩවා අත්විඳි අලාභ හේතුවෙන් එහි ප්‍රදර්ශනාගාරයේ මෙහෙයුම් කටයුතු 2018 සැප්තැම්බර් මාසයේ දී අවසන් කරන ලදි.

| 4. වෙනත් ආදායම් | | |
|---|---|---|
| කුලී ආදායම් | 11,786,674 | 10,048,825 |
| ඉතුරුම් ගිණුම් මත පොලී | 50,318 | - |
| සංචාරක බංගලා වෙන්කරවා ගැනීම් | 2,500 | 151,500 |
| විදේශ විනිමය ලාභය | 12,052 | 449,932 |
| | **11,851,544** | **10,650,257** |

| 5. මූල්‍ය පිරිවැය | | |
|---|---|---|
| බංකු ගාස්තු | 378,449 | 388,862 |
| අයිරා පොලිය | 95,374 | 1,422,599 |
| ණය පොලිය | 50,815,340 | 68,609,780 |
| | **51,289,163** | **70,421,241** |

# ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
## මූල්‍ය ප්‍රකාශවලට සටහන්

### 6. පෙර බදු ආදායම

පහත වියදම් ද ඇතුළුව සියලු වියදම් අය කිරීමෙන් පසුව පෙර බදු ආදායම සඳහන් කර ඇත.

| | 2018 | 2017 |
|---|---|---|
| | රු. | රු. |
| අධ්‍යක්ෂ ගාස්තු සහ මණ්ඩල රැස්වීම් වියදම් | 1,273,960 | 1,469,870 |
| විගණන ගාස්තු | 1,568,720 | 300,000 |
| විගණන නොවන සේවා - වෙනත් | - | 1,487,863 |
| දේපළ, පිරියත හා උපකරණ මත ක්ෂයවීම් | 24,329,922 | 28,398,039 |
| කාර්ය මණ්ඩල පිරිවැය - | | |
| නිශ්චිත දායකත්ව සැලැස්මෙහි පිරිවැය | 9,818,356 | 9,701,142 |
| නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මෙහි පිරිවැය | 6,704,212 | 6,467,126 |
| වැටුප් හා දීමනා | 115,989,192 | 114,157,341 |
| කාර්ය මණ්ඩල පුහුණු හා සංවර්ධන පිරිවැය | 201,500 | 279,000 |
| නීති ගාස්තු | 1,328,213 | 672,342 |
| මෙහෙයුම් කල්බදු කුලී | 44,555,559 | 52,124,454 |
| අනුග්‍රාහකත්ව හා පරිත්‍යාග | 268,778 | 780,493 |

### 7. බදු

ආයතනයේ නෛතික ස්වභාවය, සංකීර්ණතා සහ මෙහෙයුම් වල විශේෂිත ස්වභාවය කරණ කොටගෙන ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ බදු බැඳියාවේ තත්වය තක්සේරු කළ යුත්තේ දේශීය ආදායම් දෙපාර්තුමේන්තුව හා එක්ව සිදු කෙරෙන උපදෙස් විමසුම් අනුසාරයෙනි. කෙසේ වුවද, ප්‍රවර්තන වර්ෂය තුළ උද්ගත වූ ලාභය කරණ කොටගෙන අදාළ වර්ෂය සඳහා රු. 5,149,400 ක් වූ බදු ප්‍රතිපාදනයක් ලබා දීමට මණ්ඩලය විසින් තීරණය කරන ලදි.

## 8. දේපළ, පිරියත හා උපකරණ

| | සටහන් | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|---|
| සිත්නක්කාර වත්කම් | 8.1 | 746,074,570 | 768,287,339 |
| ගොඩනැගිලි සංවර්ධන පිරිවැය | 8.2 | 247,038,787 | 272,378,787 |
| | | **993,113,357** | **1,040,666,126** |

### 8.1 සිත්නක්කාර වත්කම්

| | ඉඩම් | ගොඩනැගිලි | පිරියත හා උපකරණ | ගෘහ භාණ්ඩ සවිකිරීම් හා කාර්යාල උපකරණ | පරිගණක උපාංග | බඩු බාහිරාදිය | නොනිම් ප්‍රාග්ධන වැඩ | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **පිරිවැය හෝ තක්සේරු වටිනාකම** | | | | | | | | |
| 2017 ජනවාරි 01 දිනට ශේෂය | 395,520,000 | 248,686,043 | 97,920,287 | 58,733,049 | 30,162,658 | 28,745,527 | 45,451,390 | **905,218,954** |
| එකතු කිරීම් | - | 101,717 | 2,647,183 | 242,316 | 461,445 | 1,765,648 | - | **5,218,309** |
| ව්‍යපහරණ | | | | | | | | - |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **395,520,000** | **248,787,760** | **100,567,470** | **58,975,365** | **30,624,103** | **30,511,175** | **45,451,390** | **910,437,263** |
| එකතු කිරීම් | 517,214 | 10,000 | 34,250 | 694,808 | 262,305 | 598,575 | - | **2,117,152** |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **396,037,214** | **248,797,760** | **100,601,720** | **59,670,173** | **30,886,408** | **31,109,750** | **45,451,390** | **912,554,415** |
| **ක්ෂයවීම** | | | | | | | | |
| 2017 ජනවාරි 01 දිනට ශේෂය | - | 22,652,373 | 34,627,445 | 22,680,172 | 23,121,906 | 10,669,989 | - | **113,751,885** |
| වර්ෂය සඳහා අයකිරීම | - | 4,992,742 | 8,440,660 | 5,893,284 | 6,041,194 | 3,030,159 | | **28,398,039** |
| **2017 දෙසැම්බර් 31 දිනට ශේෂය** | - | 27,645,115 | 43,068,105 | 28,573,456 | 29,163,100 | 13,700,148 | - | **142,149,924** |
| වර්ෂය සඳහා අයකිරීම | - | 4,995,281 | 10,058,905 | 5,905,043 | 309,602 | 3,061,090 | | **24,329,921** |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | - | **32,640,396** | **53,127,010** | **34,478,499** | **29,472,702** | **16,761,238** | - | **166,479,845** |
| **ඉදිරියට ගෙනයන මුදල් ප්‍රමාණ** | | | | | | | | |
| 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය | 395,520,000 | 221,142,645 | 57,499,365 | 30,401,909 | 1,461,003 | 16,811,027 | 45,451,390 | 768,287,339 |
| **2018 දෙසැම්බර් 31 දිනට ශේෂය** | **396,037,214** | **216,157,364** | **47,474,710** | **25,191,674** | **1,413,706** | **14,348,512** | **45,451,390** | **746,074,570** |

### 8.2 ගොඩනැගිලි සංවර්ධන පිරිවැය

| | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|
| **පිරිවැය හෝ විලම්බිත පිරිවැය** | | |
| ජනවාරි 01 දිනට ශේෂය | 384,452,630 | 384,452,630 |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | 384,452,630 | 384,452,630 |
| **ක්‍රමක්ෂය** | | |
| ජනවාරි 01 දිනට ශේෂය | **112,073,843** | 89,112,939 |
| වර්ෂය සඳහා අයකිරීම | 25,340,000 | 22,960,904 |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **137,413,843** | 112,073,843 |
| **ඉදිරියට ගෙනයන මුදල් ප්‍රමාණ** | | |
| ජනවාරි 01 දිනට ශේෂය | 272,378,787 | 295,339,691 |
| **දෙසැම්බර් 31 දිනට ශේෂය** | **247,038,787** | 272,378,787 |

ගොඩනැගිලි සංවර්ධන පිරිවැය ක්‍රමක්ෂය කිරීම යුහුසුළු කරනු සඳහාත්,වර්ෂය සඳහා රු. 25,340,000 ක් වූ මුදල (2017 - රු. 25,340,000) ප්‍රාග්ධන ප්‍රදාන විලම්බිත ආදායම් අයකිරීම සමඟ සමපාත කරනු සඳහාත් ගොඩනැගිලි සංවර්ධන පිරිවැය ක්‍රමක්ෂය අය රු. 2,379,096 ක් වූ මුදලකින් ඉහළ දැමිණි.

# ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශවලට සටහන්

8.2 ගොඩනැගිලි සංවර්ධන පිරිවැය තවදුරටත්

ක්‍රමක්ෂය

| ස්ථානය | වර්ෂය | උද්ගත වූ පිරිවැය | අනුපාතය | 2018 ජනවාරි 01 වන දිනට සමුච්චිත ක්‍රමක්ෂය ශේෂය | 2018 වර්ෂය තුළ ක්‍රමක්ෂිත ප්‍රමාණය | 2018 දෙසැම්බර් 31 වන දිනට සමුච්චිත ක්‍රමක්ෂය ශේෂය | 2018 දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි සංවර්ධන පිරිවැයෙහි ඉදිරියට ගෙන යන මුදල් ප්‍රමාණ |
|---|---|---|---|---|---|---|---|
| කෞතුකාගාරය | 2013 | 172,847,765 | | | | | |
| කෞතුකාගාරය | 2014 | 1,881,295 | | | | | |
| කෞතුකාගාරය | 2015 | 389,177 | | | | | |
| එකතුව | | 175,118,237 | 6% | 43,646,555 | 10,101,214 | 53,747,769 | 121,370,468 |
| බත්තරමුල්ල | 2013 | 117,704,905 | | | | | |
| බත්තරමුල්ල | 2014 | 7,119,771 | | | | | |
| බත්තරමුල්ල | 2015 | 9,744,207 | | | | | |
| එකතුව | | 134,568,883 | 6% | 32,311,811 | 7,762,237 | 40,074,048 | 94,494,835 |
| පින්නවල | 2013 | 10,086,000 | 10% | 5,043,000 | 1,008,600 | 6,051,600 | 4,034,400 |
| වාගොල්ල | 2014 | 810,487 | 10% | 324,193 | 81,049 | 405,242 | 405,245 |
| පේරාදෙනිය | 2013 | 31,657,966 | | | | | |
| පේරාදෙනිය | 2014 | 8,968,353 | | | | | |
| පේරාදෙනිය | 2015 | 677,220 | | | | | |
| එකතුව | | 41,303,539 | 10% | 19,619,490 | 4,130,354 | 23,749,844 | 17,553,695 |
| වැලිපැන්න | 2013 | 10,269,019 | 10% | 5,134,511 | 1,026,902 | 6,161,413 | 4,107,606 |
| රේස් කෝස් | 2013 | 1,113,613 | 10% | 556,804 | 111,361 | 668,165 | 445,448 |
| කටුනායක | 2013 | 1,060,000 | 10% | 530,000 | 106,000 | 636,000 | 424,000 |
| උණවටුන | 2013 | 1,000,000 | 10% | 500,000 | 100,000 | 600,000 | 400,000 |
| කේ - සෝන් | 2013 | 8,353,071 | 10% | 4,176,535 | 835,306 | 5,011,841 | 3,341,230 |
| තුම්මුල්ල | | 769,781 | 10% | 230,944 | 76,977 | 307,921 | 461,860 |
| **මුළු එකතුව** | | **384,452,630** | | **112,073,843** | **25,340,000** | **137,413,843** | **247,038,787** |

# ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
## මුල්‍ය ප්‍රකාශවලට සටහන්

| 9. භාණ්ඩ වට්ටෝරු | සටහන් | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|---|
| ප්‍රමුඛ තත්වයේ නිමි භාණ්ඩ අලෙවි කරන ප්‍රදර්ශනාගාර | | 443,175,876 | 570,105,686 |
| ද්විතීයක තත්වයේ නිමි භාණ්ඩ | | 14,810,411 | 5,839,706 |
| අමු ද්‍රව්‍ය හා කෙරෙමින් පවත්නා වැඩ | 9.1 | 5,397,990 | 3,003,603 |
| | | **463,384,277** | 578,948,995 |

### 9.1 අමු ද්‍රව්‍ය හා කෙරෙමින් පවත්නා වැඩ

අමු ද්‍රව්‍ය හා කෙරෙමින් පවත්නා වැඩ, සේවාලාභී රුචිකත්වය මත සිදු කළ සෘජු ඇණවුම් වෙනුවෙන් නිම වූ භාණ්ඩ වලින් සමන්විත වේ.

| 10. වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | සටහන් | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|---|
| වෙළඳ ලැබිය යුතු දෑ | | 38,689,773 | 45,383,910 |
| වෙනත් ලැබිය යුතු දෑ | 10.1 | 6,367,938 | 4,477,411 |
| තැන්පතු, හා පූර්ව ගෙවීම් | 10.2 | 38,000,723 | 82,456,827 |
| අදාළ සමාගම් වෙතින් ලැබිය යුතු දෑ | 10.3 | 25,660,481 | 64,146,044 |
| | | **108,718,915** | 196,464,192 |

### 10.1 වෙනත් ලැබිය යුතු දෑ

| | | |
|---|---|---|
| කාර්ය මණ්ඩල ණය | 113,750 | 161,250 |
| ලැබිය යුතු කුලී | 315,000 | 1,988,169 |
| ලැබිය යුතු ආර්ථික සේවා ගාස්තු | 5,939,188 | 2,252,357 |
| ලැබිය යුතු අගය එකතු කළ බදු | - | 64,765 |
| වවුචර් පත්‍ර විකුණුම් වලින් ලැබිය යුතු දෑ | - | 10,870 |
| | **6,367,938** | 4,477,411 |

### 10.2 තැන්පතු හා පූර්ව ගෙවීම්

| | | |
|---|---|---|
| ඇප තැන්පතු | 1,849,424 | 1,925,446 |
| පූර්ව ගෙවීම් | 8,993,600 | 16,531,699 |
| ගෙවන ලද අත්තිකාරම් | 11,932,359 | 13,150,649 |
| හානියට පත් තොග පාලන ගිණුම | - | 19,851,106 |
| රඳවා ගැනුම් මුදල් | 500,000 | 12,502,564 |
| ආපසු ගෙවිය යුතු තැන්පතු | 14,715,340 | 17,834,049 |
| වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය | - | 77,993 |
| ලැබිය යුතු ඇප | 10,000 | 583,321 |
| | **38,000,723** | 82,456,827 |

### 10.3 අදාළ සමාගම් වෙතින් ලැබිය යුතු දෑ

| | | |
|---|---|---|
| ව්‍යාපෘතිය වෙතින් ලැබිය යුතු මුදල් | - | 38,485,563 |
| අපේ ගම වෙතින් ලැබිය යුතු මුදල් | 25,660,481 | 25,660,481 |
| | **25,660,481** | 64,146,044 |

# ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
## මුල්‍ය ප්‍රකාශවලට සටහන්

| | 2018 | 2017 |
|---|---|---|
| | රු. | රු. |
| **11. මුදල් හා මුදල් සමාන දෑ** | | |
| බැංකුවේ ඇති මුදල් | 22,832,694 | 4,622,369 |
| අතැති මුදල් | 1,618,606 | 4,848,307 |
| | **24,451,300** | **9,470,676** |
| **12. ආදායම් සංචිත වල වෙනත් අංග** | | |
| ආරම්භක ශේෂය | 38,180,995 | 35,648,094 |
| හිඟ වැටුප් | - | 2,644,485 |
| පූර්ව වර්ෂ සමාලෝචනය | 139,836,768 | (111,584) |
| | **178,017,763** | 38,180,995 |

ආදායම් සංචිත වල වෙනත් අංග වලට, සමුච්චිත ආදායම් සංචිත මගින් අතීතයට බලපැවැත්වෙන පරිදි ඇතුළත් කරන ලද පූර්ව කාල පරිච්ඡේද වලට අදාළ සංශෝධන අන්තර්ගත වේ.

| | 2018 | 2017 |
|---|---|---|
| | රු. | රු. |
| **13. විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්** | | |
| ආරම්භක ශේෂය | 38,062,261 | 33,987,980 |
| වර්ෂය සඳහා පාරිතෝෂික ප්‍රතිපාදන | 6,704,212 | 6,467,126 |
| වර්ෂය තුළ ගෙවන ලද පාරිතෝෂික ප්‍රතිපාදන | (574,994) | (2,392,845) |
| අවසාන ශේෂය | **44,191,479** | 38,062,261 |

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම පිළිබඳ පනත යටතේ විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් සඳහා වූ වගකීම ආයතනයේ සේවක සේවිකාවන් 135 දෙනෙකු ආවරණය වන්නා වූ නිශ්චිත ප්‍රතිලාභ සැලැස්මකි.

## 14. විලම්බිත ආදායම

ප්‍රදානය පිළිබඳ විස්තරය

| | වර්ෂය | ක්‍රමක්ෂය අනුපාතය | මුලින් ලද ප්‍රදානය | 2017 දෙසැම්බර් 31 දිනට ක්‍රමක්ෂය නොකළ ශේෂය | 2018 වර්ෂය තුළ ක්‍රමක්ෂිත ප්‍රමාණය | 2018 දෙසැම්බර් 31 දිනට ක්‍රමක්ෂය නොකළ ශේෂය |
|---|---|---|---|---|---|---|
| ආර්ථික සංවර්ධන | **2012** | 10% | 100,000,000 | 40,000,000 | 10,000,000 | 30,000,000 |
| වෙළඳ හා වාණිජ අමාත්‍යාංශය | **2013** | 10% | 36,000,000 | 18,000,000 | 3,600,000 | 14,400,000 |
| අයවැය මගින් වෙන්කිරීම | **2013** | 10% | 10,224,643 | 5,112,321 | 1,022,464 | 4,089,857 |
| අයවැය මගින් වෙන්කිරීම | **2013** | 10% | 42,109,637 | 25,265,782 | 4,210,964 | 21,054,818 |
| අයවැය මගින් වෙන්කිරීම | **2013** | 10% | 11,099,920 | 5,549,960 | 1,109,992 | 4,439,968 |
| අයවැය මගින් වෙන්කිරීම | **2013** | 10% | 7,828,426 | 3,914,216 | 782,843 | 3,131,373 |
| ආර්ථික සංවර්ධන | **2014** | 10% | 35,000,000 | 21,000,000 | 3,500,000 | 17,500,000 |
| අයවැය මගින් වෙන්කිරීම | **2014** | 10% | 11,137,374 | 6,682,434 | 1,113,737 | 5,568,697 |
| **එකතුව** | | | **253,400,000** | **125,524,713** | **25,340,000** | **100,184,713** |

# ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
## මුල්‍ය ප්‍රකාශවලට සටහන්

| | සටහන් | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|---|
| **15. දිගු කාලීන ණය ගැනීම්** | | | |
| ආරම්භක ශේෂය | | 364,484,161 | 442,592,787 |
| වර්ෂය තුළ ලද ණය | | 11,700,000 | 38,300,000 |
| වර්ෂය තුළ ගෙවන ලද ණය | | (72,254,789) | (116,408,626) |
| අවසාන ශේෂය | | 303,929,372 | 364,484,161 |
| (අඩු කළා) වසරක් තුළ දී ගෙවිය යුතු ණය | 17 | (139,319,028) | (166,655,770) |
| **දිගු කාලීන ණය බැදීම්** | | **164,610,344** | **197,828,391** |

**15.1** ලංකා බැංකුව - රු. මි. 950

පරිභ්‍රමණ ණය පදනමක් මත සැපයුම්කාර පාර්ශවයන් වෙත ගෙවීම් සිදු කිරීම සඳහා ලංකා බැංකුව වෙතින් රු. මි. 150 ක් වූ ණය පහසුකමක් ලබා ගැනීම පිණිස කටයුතු පිළියෙළ කරන ලද අතර ඉන් පසුව එම ණය පහසුකම 2018 වර්ෂය තුළ රු. මි. 125 ක් වූ ප්‍රමාණයක් දක්වා අඩු කරන ලදි. ඉදිකිරීම් වියදම් සපුරා ගනු පිණිස කාරක ප්‍රාග්ධන අවශ්‍යතා මූල්‍යයනය කිරීම සඳහා රු. මි. 300 ක් වූ වෙනත් ණය මුදලක් තවදුරටත් ලබා ගන්නා ලද අතර එම ණය මුදල ද ලබා ගැනීමට කටයුතු කරන ලද්දේ රු. මි. 497 ක් වූ වටිනාකමකින් යුතුව ගණනය කර තිබූ කොළඹ කොටුවේ පිහිටි ගොඩනැගිල්ල ලංකා බැංකුව වෙත උකස් කිරීම මගින් එම බැංකුවම මගිනි

**15.2** ලංකා බැංකුව - රු. මි. 50 (අමතර ණය ඉල්ලීම)

කාරක ප්‍රාග්ධන හා මෙහෙයුම් කටයුතු අවශ්‍යතා ආවරණය කරනු පිණිස 2017 වර්ෂයේ දී ලංකා බැංකුව වෙතින් රු. මි. 50 ක් වූ ණය මුදලක් අයදුම් කරනු ලැබුව ද ඉන් ලබා ගත හැකි වූයේ රු. මි. 38.3 ක් වූ මුදලක් පමණි. ඉතිරි රු. මි. 11.7 ක් වූ මුදල ලැබුනේ 2018 වර්ෂයේ දී ය.

**15.3** ප්‍රාදේශීය සංවර්ධන බැංකුව - රු. මි. 200

හදිසි කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලනු පිණිස ග්‍රාමීය සංවර්ධන බැංකුවේ කැළණිය ශාඛාව වෙතින් රු. මි. 200 ක ණය පහසුකමක් ලබා ගැනුණි. මහ භාණ්ඩාගාරය විසින් අදාළ ණය පහසුකම පිළියෙළ කර දෙනු ලැබූ හෙයින් ඒ සඳහා ලක්සල ආයතනය විසින් කිසිදු ඇප මුදල් තැබීමක් සිදු කර නොමැත.

**15.4** භාණ්ඩාගාර ණය - රු. මි. 15

0% ක් වූ අනුපාතය මත සැපයුම්කාර පාර්ශව ගෙවීම් බේරුම් කිරීම සඳහා රාජ්‍ය භාණ්ඩාගාරය වෙතින් රු. මි. 15 ක ණය පහසුකමක් ලබා ගැනුණි.

# ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

**මුල්‍ය ප්‍රකාශවලට සටහන්**

| | සටහන් | 2018<br>රු. | 2017<br>රු. |
|---|---|---|---|
| **16. වෙළඳ හා වෙනත් ගෙවිය යුතු දෑ** | | | |
| වෙළඳ ගෙවිය යුතු දෑ | | 392,544,616 | 374,200,441 |
| වෙනත් ගෙවිය යුතු දෑ | | 101,510,827 | 150,171,130 |
| උපචිත වියදම් | | 29,991,428 | 28,494,347 |
| | | **524,046,871** | **552,865,918** |
| **17. කෙටි කාලීන ණය ගැනීම්** | | | |
| දිගු කාලීන ණය බැඳීම්හි ප්‍රවර්තන කොටස | | 139,319,028 | 166,655,770 |
| කෙටි කාලීන ණය | | 136,069,359 | 131,944,487 |
| | | **275,388,387** | **298,600,257** |
| **18. බැංකු අයිරා** | | | |
| බැංකු අයිරා | | **15,891,004** | **29,067,244** |

රු. 15,891,004 ක් වශයෙන් ගණනය වන බැංකු අයිරාව (2017 - රු. 29,067,244) වනුයේ වසර අවසානයට මුදල් පොතෙහි පෙන්නුම් කෙරෙන ශේෂය යි. ලංකා බැංකුව වෙතින් ලබා ගැනුණු රු. මි. 125 ක් වූ වත්මන් පරිභ්‍රමණ ණය මුදල හැර ලක්සල ආයතනය සතු වෙනත් බැංකු අයිරා නොමැත. (කරුණාකර 15 වන සටහන බලන්න)

## ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය
මූල්‍ය ප්‍රකාශවලට සටහන්

### 19. අවිනිශ්චිත වගකීම් හා බැඳීම්

මණ්ඩලයට එරෙහි නීන්දු අපේක්ෂිත නඩු කටයුතු

| අධිකරණ නඩු අංකය | නඩුව ගොනු කළ දිනය | නඩුව ගොනු කරන ලද්දේ කවරෙකු විසින් ද යන වග | නඩුවේ ස්වභාවය | වර්තමාන තත්වය |
|---|---|---|---|---|
| DMR/0280/13 | 2015 ජූලි 13 | කෝට්ටේ මහ නගර සභාව | කෝට්ටේ මහ නගර සභාව විසින් ලක්සල ආයතනයට එරෙහිව සූර්ය කෝෂ පැනල සවි කිරීමේ ගිවිසුම සම්බන්ධයෙන් ඩිස්ත්‍රික් අධිකරණයෙහි ගොනු කරන ලද නඩුව | රු. 4,020,000 ක මුදල් ප්‍රමාණයක් එහි පොලිය ද, සහිතව කෝට්ටේ මහ නගර සභාව වෙත ගෙවන ලෙස නීන්දුව ලබා දී ඇත. එසේ වුව ද, ලක්සල ආයතනය විසින් මෙම නඩුව සම්බන්ධයෙන් අභියාචනයක් ගොනු කර ඇත. අධිකරණ නීන්දුව ලබා දී ඇති බැවින් 2018 දෙසැම්බර් මස 31 වන දිනට ගෙවීමට නියමිතව ඇතැයි දැක්වෙන ඒ හා සමාන මුදලක් ප්‍රතිපාදනය කර ඇත. |
| DMR/2255/16 | 2016 මැයි 09 | සී/ස ඩිමෝ සමාගම | නියමිත ශේෂ මුදල් නොගෙවීම හේතුවෙන් ඩිමෝ සමාගම විසින් ලක්සල ආයතනයට එරෙහිව අදාළ ගිවිසුම කඩ කිරීම සම්බන්ධයෙන් ඩිස්ත්‍රික් අධිකරණයෙහි පවරා ඇති නඩුව | නීන්දුව මේ දක්වා ලැබී නොමැති අතර ඊට අදාළ වෙතැයි අපේක්ෂිත කිසිදු වගකීමක් 2018 දෙසැම්බර් මස 31 වන දිනට නොපවතියි. |
| 138/2018/MR | 2018 මාර්තු 08 | සී/ස ජැට් හෝල්ඩිංස් සමාගම | ලක්සල ආයතනය විසින් සංචාරක මණ්ඩලය වෙතින් ලබා ගෙන ජැට් හෝල්ඩිංස් සමාගම වෙත ලබා දුන් උප කොන්ත්‍රාත්තුවට අදාළ ගිවිසුම සහ ඒ වෙනුවෙන් ගෙවීමට නියමිත රු. 8,184,683.49 ක් වූ මුදල හා සම්බන්ධ ගිවිසුම පිළිබඳ කොළඹ වාණිජ මහ අධිකරණයෙහි ගොනු කරන ලද නඩුව | නීතිපති දෙපාර්තුමේන්තුව ලක්සල ආයතනය (ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය) වෙනුවෙන් විරෝධතා ගොනු කර ඇත. |
| 139/2018/MR | 2018 අප්‍රේල් 10 | සී/ස ජැට් හෝල්ඩිංස් සමාගම | ලක්සල ආයතනය, ලෝක වෙළඳ මධ්‍යස්ථාන ගොඩනැගිල්ලෙහි 22 වන මහලේ පිහිටි ආරවුල් සමථ මධ්‍යස්ථානයක් අලුත්වැඩියා කිරීම සඳහා අධිකරණ අමාත්‍යාංශය සමඟ ගිවිසුම්කට වළඹ ඇත. ලක්සල ආයතනය විසින් මෙම කටයුත්ත උපකොන්ත්‍රාත්තුවක් ලෙස ජැට් හෝල්ඩිංස් සමාගම වෙත ලබා දී ඇති අතර එම සමාගම අදාළ අලුත්වැඩියාව නිම කර ඇත. නමුත් අධිකරණ අමාත්‍යාංශය, ජැට් හෝල්ඩිංස් සමාගම වෙත ගෙවිය යුතු එම කාර්යයට අදාළ ඉතිරි මුදල් ගෙවා බේරුම් කර නොනිබුණි. එහෙයින් රු. 32,256,980 ක් වූ මුදල් බේරුම් නොකිරීම සම්බන්ධයෙන් සී/ස ජැට් හෝල්ඩිංස් සමාගම විසින් ලක්සල ආයතනයට එරෙහිව කොළඹ මහ අධිකරණයෙහි නඩුවක් පවරා ඇත. | නීතිපති දෙපාර්තුමේන්තුව ලක්සල ආයතනය (ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය) වෙනුවෙන් විරෝධතා ගොනු කර ඇත. |

### අභ්‍යන්තර පරීක්ෂණ

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයට අයත් 2015 වර්ෂයේ දී වැඩ තහනම් කරන ලද ජ්‍යෙෂ්ඨ නිලධාරීන් දෙදෙනෙකුට එරෙහිව අභ්‍යන්තර පරීක්ෂණ සිදු කෙරෙමින් පවතී.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ටීසීඑම්/ඒ/එස්එල්එච්බී/125/2018/එෆ්ඒ
ඔබේ අංකය / உமது இல. / Your No. }
දිනය / திகதி / Date } 2019 අගොස්තු 13 දින

සභාපති
ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය

**ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 අහිතකර මතය

ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ අහිතකර මතය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් මණ්ඩලයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 අභිතකර මතය සඳහා පදනම

(අ) සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලය විසින් SAP පරිගණකගත ගිණුම් ක්‍රමය තුළ පවත්වාගෙන ගිය මුදල් පොතට ජර්නල් සටහන් භාවිතා කර ගණුදෙනු ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව අංක 7264 ජංගම ගිණුම සඳහා පවත්වාගෙන ගිය මුදල් පොතේ ජර්නල් සටහන් 24 ක් භාවිතා කර හර හෝ බැර එකතු වටිනාකම රු.7,155,350 ක ගණුදෙනු ගිණුම්ගත කර තිබූ අතර, අංක 6526 දරන ජංගම ගිණුමට අදාළ මුදල් පොතේ ජර්නල් සටහන් 40 ක් භාවිතා කර හර හෝ බැර එකතු වටිනාකම් රු.32,221,464 ක ගණුදෙනු ගිණුම්ගත කර තිබුණි.

(ආ) 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන සමඟ වූ පාරිතෝෂික වෙන් කිරීම් උපලේඛනය අනුව මුළු පාරිතෝෂික වෙන් කිරීම් වටිනාකම රු.43,633,230 ක් වුවත්, එදිනට ලෙජරය අනුව පාරිතෝෂික වෙන් කිරීම් වටිනාකම රු.43,319,441 ක් වීම නිසා ලෙජරය අනුව පාරිතෝෂික වෙන් කිරීම රු.313,789 ක් අඩුවෙන් සටහන් කර තිබුණි.

(ඇ) 2018 දෙසැම්බර් 31 දිනට විශේෂ ඇණවුම් මත විකුණන ලද භාණ්ඩ වල පිරිවැය එකතුව වටිනාකම රු.5,508,020 ක වටිනාකමත්, SAP පරිගණක මෘදුකාංගයට ලබාදී තිබූ දෝෂ සහිත විධානයක් නිසා එම වටිනාකම විශේෂ ඇණවුම් මත විකුණුම් ගිණුමට හර කර තිබුණි. එම වරද නිවැරදි කිරීමට යොදන ලද ජර්නල් සටහන දෝෂ සහිත වීම නිසා විකුණුම් බඩුවල පිරිවැය ගිණුමට හර විය යුතු රු.5,508,020 ක් විශේෂ ඇණවුම් ගබඩා තොග ගිණුම හර කර තිබුණි. මෙම දෝෂ සහිත ජර්නල් සටහන නිසා 2018 දෙසැම්බර් 31 දිනට රු.5,508,020 කින් විකුණුම් බඩුවල පිරිවැය ගිණුම අඩුවෙන් සටහන් වී තිබූ අතර, විශේෂ ඇණවුම් ගබඩා තොග ගිණුම එම වටිනාකමින් වැඩියෙන් සටහන් කර මූල්‍ය ප්‍රකාශන සකස් කර තිබුණි.

(ඈ) 2018 දෙසැම්බර් 31 දිනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ හිඟ බදු වාර්තාව අනුව ගෙවිය යුතු වැටි බදු ශේෂය රු.716,749 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු බදු වටිනාකම රු.5,664,297 ක් ලෙස සටහන් කිරීම නිසා ගෙවිය යුතු වැටි බදු ගිණුමේ ශේෂය රු.4,947,548 ක් වැඩියෙන් සටහන් කර තිබුණි. උක්ත හිඟ බදු වාර්තාව ප්‍රකාරව හිඟ වැටි බදු වෙනුවෙන් ගෙවිය යුතු දඩ මුදල් වූ එකතුව රු.1,877,463 ක් සමාලෝචිත වර්ෂය තුළ ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) 2018 දෙසැම්බර් 31 දිනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ හිඟ බදු වාර්තාව අනුව ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු වටිනාකම් රු.5,383.496 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල එම බදු වටිනාකම් රු.28.562.386 ක් ලෙස සටහන් කිරීම නිසා ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු වටිනාකම් රු.23.178.890 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර තිබුණි. උක්ත හිඟ බදු වාර්තාව ප්‍රකාරව හිඟ ජාතිය ගොඩනැගීමේ බදු වෙනුවෙන් ගෙවිය යුතු දඩ මුදල් එකතුව රු.5,365.512 ක් සමාලෝචිත වර්ෂය තුළ ගිණුම්ගත කර නොතිබුණි.

(ඊ) 2018 දෙසැම්බර් 31 දිනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ හිඟ බදු වාර්තාව අනුව ගෙවිය යුතු ආර්ථික සේවා බදු (ESC) ශේෂය රු.2,926,736 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු එම බදු වටිනාකම් රු.23.332.443 ක් ලෙස සටහන් කිරීම නිසා ගෙවිය යුතු ආර්ථික සේවා බදු වටිනාකම් රු.20.405.707 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල සටහන් කර තිබුණි. උක්ත හිඟ බදු වාර්තාව ප්‍රකාරව ගෙවිය යුතු ආර්ථික සේවා බදු වෙනුවෙන් ගෙවිය යුතු දඩ මුදල් එකතුව රු.1,546.935 ක් සමාලෝචිත වර්ෂය තුළ ගිණුම්ගත කර නොතිබුණි.

(උ) 2018 දෙසැම්බර් 31 දිනට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ හිඟ බදු වාර්තාව අනුව මණ්ඩලය විසින් ගෙවිය යුතු හිඟ ආදායම් බදු ශේෂය රු.22,387,108 ක් වූ අතර, හිඟ ආදායම් බදු අධිභාරය රු.590,768 ක් විය. මණ්ඩලය විසින් පූර්ව වර්ෂ වලදී ආදායම් බදු සහ අධිභාර මුදල් ගණනය කර ගිණුම්ගත කර නොතිබූ අතර, මෙම ගෙවිය යුතු ආදායම් බදු සහ අධිභාර මුදල් වෙනුවෙන් ගෙවිය යුතු දඩ මුදල රු.2.481,404 ක් වූ අතර, එම වටිනාකමද ගෙවිය යුතු වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඌ) 2018 වර්ෂයේ ක්ෂය ගණනය කිරීමේදී එකතු වටිනාකම් රු.48,984,819 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි සඳහා ක්ෂය ගණනය නොකිරීම නිසා, එකතුව රු.1,224.620 ක් අඩුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය ගණනය කර ගිණුම්ගත කර තිබුණි.

(එ) 2018 දෙසැම්බර් 31 දිනට ලෙජර් ගිණුම් ශේෂ, ගිණුම් උපලේඛන සහ මූල්‍ය ප්‍රකාශන සමඟ පරීක්ෂා කිරීමේදී ලෙජර් ගිණුම් 02 කට අදාළව එකතුව රු.718,258 ක් මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් සටහන් කර තිබුණි.

(ඒ) 2018 දෙසැම්බර් 31 දිනට භාණ්ඩ සැපයුම්කරුවන්ට ගෙවීම් සඳහා මිලදී ගැනුම් මධ්‍යස්ථාන 05 ක් වෙත ලබාදී තිබූ එකතු වටිනාකම රු.2,225,750 ක නිරවුල් නොකල අත්තිකාරම් වටිනාකම් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී පූර්ව ණයහිමි වටිනාකම්වන් අඩු කර පෙන්වීම නිසා ණයහිමියන් එම වටිනාකම්වන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශන වල සටහන් කර තිබුණි.

(ඔ) මණ්ඩලය වෙත 2015, 2016 සහ 2017 ගිණුම් වර්ෂ සඳහා පවා විගණන ගාස්තු ඉන්වොයිස් පත්‍ර නිකුත් කිරීමට ජාතික විගණන කාර්යාලය වෙත එකඟතාවය එල නොකිරීම නිසා විගණන ගාස්තු සඳහා වන ඉන්වොයිස් පත්‍ර නිකුත් කිරීමට නොහැකි වී තිබූ අතර, 2017 වර්ෂයේ විගණන ගාස්තුව වන රු.1,568,717 ක විගණන ගාස්තු සඳහා ප්‍රතිපාදනය සලසා නොතිබුණි.

(ඕ) 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රදර්ශනාගාර සහ තොග ගබඩා 14 කට අදාළව මූල්‍ය ප්‍රකාශන අනුව තොග වටිනාකම් එකතුව රු.434,008,464 ක් වූවත්, එම ප්‍රදර්ශනාගාර සහ තොග ගබඩාවල භෞතික තොග සම්ක්ෂණ මණ්ඩල වාර්තා අනුව තොග එකතු වටිනාකම රු.433,284,445 ක් වීම නිසා මූල්‍ය ප්‍රකාශනවල තොගය රු.724,019 ක් වැඩියෙන් සටහන් කර තිබුණි.

(ක) මූල්‍ය ප්‍රකාශනවල සටහන අංක 09 යටතේ දෙවන තත්ත්වයේ නිම භාණ්ඩ ලෙස එකතු වටිනාකම රු.14,810,411 ක් සටහන් කර තිබුණි. එම භාණ්ඩ පැහැදිලිව තොග සම්ක්ෂණ මණ්ඩල වාර්තා අනුව තොග වටිනාකම රු.7,543,723 ක් විය. ඒ අනුව එකතුව රු.7,266,688 ක් සඳහා සම්ක්ෂණ මණ්ඩල වාර්තා විගණනයට ඉදිරිපත් නොකරන ලදී.

(ග) සම්ක්ෂණ මණ්ඩල වාර්තා මඟින් වාර්ෂිකව හෙළිදරව් වූ තොග අතිරික්තයන්, ඌනතා, අලාභ හානි සහ විනාශ වූ භාණ්ඩ තොග හඳුනාගෙන ගිණුම් නිවැරදි නොකර අවිනිශ්චිත ගිණුමක ගණුදෙනු සටහන් කිරීම නිසා එම ගිණුමේ 2018 දෙසැම්බර් 31 දිනට රු.93,841,464 ක හර ශේෂයක් විය. එම හර ශේෂය පූර්ව වර්ෂ ගැළපුම් ගිණුමේ බැර ශේෂයට ඵරෙගිව කපා හැරීම නිසා අවිනිශ්චිත ගිණුමේ හර ශේෂය සහ පූර්ව වර්ෂ ගැළපුම් ගිණුමේ බැර ශේෂය මූල්‍ය ප්‍රකාශන වල රු.93,841,464 ක් අඩුවෙන් සටහන් කර තිබුණි.

(ව) 2018 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ තොග සම්බන්ධ ලෙජර් ගිණුම් 12 ක එකතු වටිනාකම් වූ රු.38,441,797 ක තොග ශේෂයක් ලිබින අනුමැතියක් රහිතව ජර්නල් සටහනක් භාවිතා කර පූර්ව වර්ෂ ගැළපුම් ගිණුම් හර කරමින් කපා හැර තිබුණි. එම නිසා 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල තොග ගිණුමේ ශේෂය සහ පූර්ව වර්ෂ ගැළපුම් ගිණුමේ බැර ශේෂය එම වටිනාකම්වලින් අඩුවෙන් සටහන් කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි.

(ඡ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01, මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ වූ ප්‍රමිතයේ 32 ඡේදය ප්‍රකාරව ආයතනයේ වත්කම් හා වගකීම් හෝ ආදායම් හා වියදම් එකිනෙකට හිලවු කළ නොහැකි බව දක්වා තිබුණද, මණ්ඩලය විසින් 2018 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් 08 ක එකතු වටිනාකම රු.32,208,102 ක් සහ ගෙවිය යුතු ගිණුම් 05 ක එකතු වටිනාකම වූ රු.32,208,102 ක අගයන් අංක 70401-00-00 දරන දිගුකල් ණය ශේෂ නිරවුල් කිරීමේ ලෙජර් ගිණුම භාවිතා කර භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමෙන් තොරව එකිනෙකට හිලවු කර මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි.

(ට) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම පිළිබඳ ප්‍රමිතයේ 110 වන ඡේදය ප්‍රකාරව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 අනුව ගිණුම්කරණ වැරදීම් අතීතානුයෝගීව ගැළපීමේදී රඳවාගත් ඉපයීමේ ගිණුමේ ආරම්භක ශේෂයට ගැළපීම් කළ යුතු වුවත්, මණ්ඩලය 2018 දෙසැම්බර් 31 දිනට ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය පිළියෙල කිරීමේදී රු.178,017,763 ක් වූ ආදායම් සංචිතයේ එකතු වටිනාකම, රඳවාගත් ඉපයීම් ගිණුමේ ආරම්භක ශේෂයට ගැළපීම් නොකර ආදායම් සංචිතයක් ලෙස ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයේ වෙනම තීරුවක ගැළපීම් කර තිබුණි.

(ඩ) උක්ත ප්‍රමිතයේ 110 වන ඡේදය ප්‍රකාරව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 08 අනුව අතීතානුයෝගීව ගැළපීම් කිරීමේදී ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීම් සහ වැරදි නිවැරදි කිරීම මගින් ඇති වූ ප්‍රතිඵල ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයේ වෙන වෙනම හෙළිදරව් කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු නොකර 2018 දෙසැම්බර් 31 දිනට එකතුව රු.139,836,768 ක් ආදායම් සංචිත ගැළපීම් ලෙස සඳහන් කර ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය පිළියෙල කර තිබුණි.

(ණ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 02 තොග සම්බන්ධ ප්‍රමිතයේ 34 වන ඡේදය අනුව තොග සම්බන්ධයෙන් හඳුනාගත් රු.93,841,464 ක් වූ පාඩුව ප්‍රමිතයේ 36 (ඊ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(ත) 2018 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ ණය කාඩ් පත්‍ර මත අලෙවි වට්නාකම රු.27,659,287 ක් විය. එකිනෙක ප්‍රදර්ශනාගාර පදනම්වත් ණය කාඩ් පත්‍ර අලෙවි වට්නාකම් සහ ණයකාඩ් අලෙවිය මත මුදල් අයවීම් විස්තර විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා මෙම මුදල අයවීමේ නිරවද්‍යතාවය පරීක්ෂා කිරීමට නොහැකි විය.

(ද) 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල ඇති එකතුව රු.11,932,359 ක් වූ නොපියවූ අන්තිකාරම් ශේෂයෙන්, එකතුව වට්නාකම රු.10,672,111 ක නොපියවූ අන්තිකාරම් වට්නාකමක් තහවුරු කර ගැනීම සඳහා සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකරන ලදී.

(න) 2018 වර්ෂයට අදාළව මණ්ඩලයේ ශුද්ධ ලාභය මත සියයට 25 ක් වූ රු.5,149,100 ක් ආදායම් බදු වගකීමක් ලෙස හිඟුම්ගත කර තිබූ අතර, ඊට අදාළ බදු ගණනය කිරීම් වාර්තා සහ බදු ගෙවීම් ලිපිගොණු හා ලිඛිත සාක්ෂි විගණන පරීක්ෂාවන් සඳහා ඉදිරිපත් නොකරන ලදී.

(ප) 2018 දෙසැම්බර් 31 දිනට එකතු වට්නාකම රු.41,217,749 ක් වූ ගෙවිය යුතු හිඟුම් 04 කට අදාළව නිරවද්‍යතාවය තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය ණයහිමි ශේෂ සනාථන ලිපි, ණයහිමි ලිපිගොණු, ණයහිමි උපලේඛන සහ ණයහිමි ශේෂ කාල විශ්ලේෂණ යන විගණන සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් නොකරන ලදී.

(ම) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ රජයේ බැංකු හිඟුම් 03 ලෙජරය අනුව එකතු වට්නාකම රු.3,428,033 ක් වුවද, බැංකු ශේෂ සනාථන ලිපි අනුව එකතු වට්නාකම රු.5,138,010 ක් වූයෙන් රු.1,709,977 ක නොසැසඳූ ශේෂයක් විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මණ්ඩලය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මහහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම් පිණිස මණ්ඩලයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තු වල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ අහිතකර මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර. මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා මණ්ඩලය පවත්වාගෙන ගොස් නැති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (III) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2 යටතේ වූ (ඇ), (ඉ), (ඊ), (උ), (ඔ), (ඕ), (ක), (ග), (ත), (ද), (ප) යන නිරීක්ෂණද, නීති රීති යටතේ වූ (අ), (ආ) (II) සහ 3 (ඇ) නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් නොමැති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

| නීති රීති/ විධානයට යොමුව | විස්තරය |
|---|---|
| (අ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ III පරිච්ඡේදයේ 21 (1) වගන්තිය | සෑම බදු කාල පරිච්ඡේදයක් සඳහාම එකතු කළ අගය මත බදු වාර්තා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවත්, 2018 වර්ෂය තුළ සුපර් බ්‍රෑන්ඩ් බිම් කුළී ආදායම මත අය කරන ලද එකතුව රු.465,750 ක බදු මුදල් ප්‍රේෂණය කිරීමට සහ බදු වාර්තා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව වෙත යැවීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| (I) 5.1.3 වගන්තිය | අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කළ සංයුක්ත සැලැස්මේ යාවත්කාලීන පිටපත් අයවැය ලේඛනය සමඟ රේඛීය අමාත්‍යාංශය, රාජ්‍ය |

| | |
|---|---|
| | සහ විගණකාධිපති වෙත මුදල් වර්ෂය ආරම්භ වීමට දින 15 කට පෙර ඉදිරිපත් කළ යුතු වුවත්. 2018 – 2022 සංයුක්ත සැලැස්ම 2018 සැප්තැම්බර් 18 දින අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර විගණනයට ඉදිරිපත් කර තිබුණි. |
| (II) 4.2.6 වගන්තිය | කාර්ය සාධන වාර්තා පිළියෙල කර කාර්තුව අවසන් වීමට දින 30 කට පෙර අදාළ ආයතන වෙත ඉදිරිපත් කර නොතිබුණි |
| (ඇ) 2018 දෙසැම්බර් 07 දිනැති පී‍ඊඩී 03/2018 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 2.2 සහ 2.3 වගන්තිය | කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ මූල්‍ය ප්‍රකාශන දින 60 ක් ඇතුළත විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු නොකර, එකතුව රු.2,160,000 ක් ගෙවිය යුතු ප්‍රසාද දීමනා ලෙස ගිණුම්ගත කර තිබුණි. |

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මණ්ඩලයේ සම්පත් සකසුරුවම් ලෙස. කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

3. අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) සමාලෝචිත වර්ෂය තුළ අපේක්ෂිත සංස්ථාපිත විකුණුම් පිරිවැටුම රු.50,000,000 ක් වුවද, සත්‍ය විකුණුම් රු.14,960 ක් වූ නිසා එම විකුණුම් ඉලක්ක ලඟා කර ගැනීමේ ප්‍රගතිය සියයට 0.03 ක් විය.

(ආ) විකුණුම් වැඩි කිරීම සඳහා නව සැපයුම්කරුවන් 250 දෙනෙකු ලියාපදිංචි කිරීමටද, හස්ත කර්මාන්ත නිෂ්පාදන සෘජුව මිලදී ගැනීම සඳහා ශිල්ප ගම්මාන 25 ක් ඇරඹීමටද ඉලක්ක කර තිබූ අතර, සමාලෝචිත වර්ෂය තුළ සැපයුම්කරුවන් 97 දෙනෙකු ලියාපදිංචි කිරීමටත්, ශිල්පීය ගම්මාන 05 ක් ඇරඹීමත් සිදු කර තිබුණි. ඒ අනුව එම අරමුණු ලඟා කර ගැනීමේ භෞතික ප්‍රගතිය පිළිවෙලින් සියයට 39 ක් සහ සියයට 20 ක් විය.

(ඇ) 2000 ජනවාරි මස සිට 2016 ජූනි මස දක්වා වූ හිඟ සේවක අර්ථ සාධක අරමුදල් සහ අධිභාර මුදල් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.6,282,072 ක් සේවක අර්ථ සාධක අරමුදල වෙත, අධිභාර මුදල් ගෙවීම් කර තිබුණි.

(ඈ) කටුබැද්ද වඩු කර්මාන්ත ව්‍යාප්තති අංශයේ ගොඩනැගිලි නිෂ්කාර්යව තිබියදී කොටුව ලක්සල ගොඩනැගිල්ලේ පවත්වාගෙන ගිය මණ්ඩලයේ ගිණුම් අංශය ඇතුළු අංශ කිහිපයක් පවත්වාගෙන යාම සඳහා පෞද්ගලික ආයතනයකින් කුළී පදනමට සමාලෝචිත වර්ෂයේදීද ගොඩනැගිලි ලබාගෙන තිබුණි. ඒ සඳහා සමාලෝචිත වර්ෂය තුළ ගොඩනැගිලි කුළී ලෙස රු.9,300,000 ක් ගෙවීම් කර තිබුණි.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති